# 2018

# කාර්ය සාධන වාර්තාව

බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය

# බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය

## දැක්ම

**" බෞද්ධ සාරධර්ම සපිරි ගුණගරුක සමාජයක් බිහිකිරීමේ ප්‍රමුඛතම පහසුකරන්නා බවට පත්වීම හා වයඹ පළාත් තිරසර සංවර්ධනයේ පෙරගමන්කරුවීම"**

## මෙහෙවර

**"බෞද්ධ ආගමික සිද්ධස්ථාන කේන්ද්‍ර කර ගනිමින්, බෞද්ධ ආගමික ඉගැන්වීම් මත පදනම් වෙමින් සියලු පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය ඇතිව සම්පත් ප්‍රසස්ථ උපයෝජනය කරන ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කර, ක්‍රියාත්මක කිරීම තුළින් යහපත් ජීවන රටාවක් සහිත ගුණගරුක සමාජයක් බිහිකිරීමට උරදීම සහ වයඹ පළාතේ ජනතාවගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම සඳහා භෞතික යටිතල පහසුකම් හා ජීවනෝපාය වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම "**

# පටුන


**පිවිසුම** **01**

**අමාත්‍යාංශය පිහිටුවීමේ පසුබිම හා අරමුණු** **02**

**1. බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය**

- අමාත්‍යාංශ කාර්යභාරය **02**
- උපාය මාර්ග **03**
- බුද්ධශාසන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්ය සාධක දර්ශක **03**
  අරමුණු හා කාර්යභාරය **04 -08**
- අමාත්‍යාංශ සංවිධාන සටහන **09**
- කාර්යමණ්ඩල පුරප්පාඩු හා සම්බන්ධ තොරතුරු **10 -12**
- අමාත්‍යාංශ සම්බන්ධීකරණ තොරතුරු **12 - 14**

**2. සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** **15**

**2.1.** සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගති සාරාංශය **15 -17**

**2.2.** සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය **17**

**2.2.1.** පූජා භූමි සංවර්ධනය **17 - 19**

**2.2.2.** කැළණිය විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම **20 - 22**

**2.2.3.** ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන **22 - 24**

**2.2.4.** ඌණ සංවර්ධිත විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන **24 -26**

**2.2.5.** තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන **27 - 31**

**2.2.6.** පුරාණ විහාර ප්‍රතිස්ථාපනය හා ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන **32 -34**

**2.2.7.** ආගමික සහජීවනය වැඩසටහනසහ අන්‍ය භාෂා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන **34**

**2.2.7.1.** ආගමික සහජීවනය වැඩසටහන **34 -36**

**2.2.7.2.** අන්‍ය භාෂා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන **36 - 37**

**2.2.8.** නේපාලයේ ඇති වූ භූමිකම්පාවෙන් හානියට පත් ආගමික සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය **38 - 29**

2.2.9. පාරම්පරික උඩරට නර්තනය සහ සංස්කෘතික උරුමයන් සුරැකීමට ශ්‍රී දළදා මාළිගාවට අනුයුක්ත ව පල්ලේකැලේ ප්‍රාසාංගික පුහුණු ආයතනයක් ආරම්භ කිරීම **40**

3. විශේෂ ව්‍යාපෘති 41

- ශාක්‍ය ජනපදය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය 41 - 42

4. වෙනත් සංවර්ධන කාර්යයන්

- නවදිල්ලි නුවර ශ්‍රී ලංකා බෞද්ධ වන්දනා විශ්‍රාම ශාලාව 43
- නේපාලයේ ලුම්බිණි නුවර පිහිටි ශ්‍රී ලංකා මහා විහාරයේ සංවර්ධන කටයුතු 43
- නේපාල දුටුගැමුණු විශ්‍රාම ශාලාව 44 -45
- අනුරාධපුර කුරුන්දන්කුලමරජරටවාරිකා නිවාසය 45 - 46

5. විවිධ විශේෂ උත්සව කටයුතු 47

- රාජ්‍ය වෙසක් උත්සවය 47
- ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 154 වන ජන්ම සංවත්සර මහෝත්සවය 47 -48

6. සංවර්ධන සේවා සැපයීම් 48

- විහාරස්ථාන කාර්ය දර්ශන මුද්‍රණය කිරීම හා බෙදා හැරීම **48**

7. තොරතුරු තාක්ෂණ හා සංවර්ධන අංශය 49 - 50

8. බෞද්ධ උපදේශක සභාව පැවැත්වීම - 2018 වර්ෂය 50

9. මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම 51

10. තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ පාර්ලිමේන්තු අධීක්ෂණ කමිටු රැස්වීමට සහභාගී වීම 51

11. මූල්‍ය කළමනාකරණය සඳහා යොදා ඇති පාලන ක්‍රමවේදය 51 -52

12. අභ්‍යන්තර විගණන කටයුතු සැලසුම් කිරීම 53

13. බුද්ධශාසන අරමුදල 53 - 56

14. වයඹ සංවර්ධන ලේකම් කාර්යාලය 57 - 62

# පිවිසුම

## *“සාරධර්ම සපිරි ගුණගරුක සමාජයක් “*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මෙරටේ බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන අතර, බුද්ධශාසනය ආරක්ෂා කිරීම, පෝෂණය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසන්නා සේම සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ද අවධාරණය කර ඇත. මෙම අදහසට අනුකූලව “මෛත්‍රී පාලනයක් ස්ථාවර රටක්” ප්‍රතිපත්ති ප්‍රකාශනයේ විසිපස් වන පිටුවේ "සියලු ආගම් වල ජනතාවට තමන්ගේ ආගමික ඇදහිලි සඳහා ඇති නිදහස සහතික කරන" බව ප්‍රකාශ කර ඇත. මෙම අරමුණ සාක්ෂාත් කරලීම පිණිස සුදුසු ව්‍යාපෘතීන් සමාජගත කිරීම හා සමස්ත ශ්‍රී ලාංකේය සමාජය ම ආවරණය වන අයුරින් යහගුණ වර්ධනයෙහි ලා ඉවහල් වන වැඩසටහන් දියත් කිරීම බුද්ධශාසන අමාත්‍යාංශයේ වගකීම බවට පත් ව ඇත. මේ අනුව බුද්ධශාසන අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ අතුරින් විශේෂ වූ රාජ්‍ය ආයතනයක් වන්නේ නිරායාසයෙනි.

සමාජ සාරධර්ම වලින් පිරිපුන් ගුණගරුක දියුණු පුරවැසියන් සහිත දේශයක් බිහිකිරීම වෙනුවෙන් කළයුතු දෑ කල් නොයවා ඉටුකළ යුතු බව අතිගරු ජනාධිපතිතුමා විසින් නිරන්තරයෙන් අවධාරණය කරනු ලබන්නේ ආධ්‍යාත්මික වශයෙන් සංවර්ධිත පුරවැසියන් සහිත දේශයක් ගොඩනැගීමේ අවශ්‍යතාවය මේ යුගයේ දී වඩාත් ප්‍රබලව දැනෙන බැවිනි. ජාතීන් අතර එකමුතුකම සහ සංහිඳියාව ප්‍රවර්ධනය කරන්නා වූ ආකල්ප ප්‍රචලිත කිරිම උදෙසා ප්‍රජාවට ආගමික නායකත්වය ලබාදීම සඳහා බුද්ධශාසන අමාත්‍යාංශය නිරන්තර මෙහෙවරක යෙදී සිටී.

ඒ අනුව බුද්ධශාසන අමාත්‍යාංශය, ඒ යටතේ ඇති බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තුමේන්තුව ද සම්බන්ධීකරණය කරමින් මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා සුවිශාල කාර්යය භාරයක් ඉටුකරයි.

## අමාත්‍යාංශය පිහිටුවීමේ පසුබිම හා අරමුණු

### " ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය."

එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙන් හා 14 වන ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර, බුද්ධශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය.

(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව)

## අමාත්‍යාංශ කාර්යභාරය

☆ සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැඟීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කරනු පිණිස බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, වයඹ සංවර්ධන ලේකම් කාර්යාලය බුද්ධශාසන අරමුදල යන ව්‍යවස්ථාපිත ආයතනයන්හි ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හා බුද්ධශාසන අරමුදලට අදාළ සියලු අනෙකුත් විෂය කටයුතු.

☆ බුදුදහම සුරක්ෂිත කොට පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය උදෙසා යෝග්‍ය වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

☆ පූජාභූමි සැළසුම්කරණය හා සංවර්ධනය කිරීම.

☆ අන්තර්ජාතික වශයෙන් ථෙරවාදි බුදුදහම ප්‍රචාරය කිරීම සඳහා කටයුතු කිරීම.

☆ උත්තරීතර අනුශාසක මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම.

☆ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, බුද්ධශාසන අරමුදල යන ආයතනයන් අධීක්ෂණය කිරීම.

☆ වයඹ සංවර්ධන ලේකම් කාර්යාලයට අදාල විෂය කටයුතු.

උපාය මාර්ග

**ඉහත කාර්යය භාරයන් කඩිනමින් සාක්ෂාත් කර ගැනිම උදෙසා පහත සඳහන් උපාය මාර්ග අනුගමනය කරන ලදී.**

- වෘත්තීත්වය හා ප්‍රායෝගික ගැටළු අවම කර ගැනීම සඳහා පූජ්‍ය පක්ෂය හා මහජනතාව සමඟ මුහුණට මුහුණලා සාකච්ඡා පැවැත්වීම.
- ppub (රාජ්‍ය සහයෝගීතා) හා PPP (රාජ්‍ය පෞද්ගලික සහයෝගිතාව) සඳහා අවශ්‍යතාවයන් අනුව පිවිසීම.
- කළමනාකරණයේ දී අවශ්‍ය වන තොරතුරු නිර්මාණය කිරීම සඳහා දත්ත ලබාගැනීම හා අවශ්‍ය තොරතුරු පදනම් කරගෙන තොරතුරු තාක්ෂණ ක්‍රියාවලියක් නිර්මාණය කිරීම.
- නව කළමනාකරණ ක්‍රමවේද භාවිතය.
- යහපත් හා තෘප්තිමත් මහජන සම්බන්ධතාවයක් ඇති කිරීම සඳහා ක්‍රමවේද හඳුන්වා දීම.
- දේශිය ඥානය හා ශ්‍රී ලාංකේය උරුමයන් සංරක්ෂණය සඳහා දෘෂ්‍ය සාක්ෂි නිර්මාණය කිරීම හා වර්තමානය සංරක්ෂණය කිරීම සඳහා ශ්‍රව්‍ය, දෘෂ්‍ය හා ලිඛිත මාධ්‍ය භාවිතය.

**බුද්ධශාසන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්ය සාධක දර්ශක**

- සංවර්ධිත ධනාත්මක සංකල්ප ශක්තිමත් කිරීම සඳහා නව පරිමාණයක් සලසමින් ධනාත්මක සංකල්ප සංවර්ධනය කරන උසස් ව්‍යුහයක් සහිතව දහම් අධ්‍යාපන ජාලය ප්‍රතිව්‍යුහගත කිරීම.
- තෝරාගත් ගම්මානවල සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා බුදු දහම උපයෝගී කරගෙන වැඩ සටහන් සම්පාදනය කිරීම.
- බෞද්ධ සංස්කෘතික සම්ප්‍රදායයන් සුරක්ෂිත කරමින් බෞද්ධ වන්දනාමාන කරන ස්ථාන ප්‍රතිසංස්කරණය කර ඒවා වර්තමාන හා අනාගත පරම්පරාව සඳහා ඉදිරියට ගෙන යාමට විවරයක් බවට පත්වීම.

- මහජනයා සැහීමකට පත් වන පරිදි හා දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ආකර්ෂණයට ලක් වන පරිදි බෞද්ධ වන්දනාමාන කරන ස්ථානයන්ගේ ජාලය ආකර්ෂමත් කිරීම.
- ථෙරවාදී බුදුදහම දේශීය හා විදේශීය වශයෙන් ව්‍යාප්ත කිරීම.
- ශ්‍රී ලංකාවේ ජීවත්වන සියළුම ජනවාර්ගික හා ආගම්වලට අයත් ජනතාව අතරේ සාමකාමී සහජීවනය පවත්වා යමින් සාරධර්ම සපිරි ගුණගරුක රටක් බවට පත් කිරීම.

## 4 අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ හා ඒවායේ කාර්ය භාරය

බෞද්ධ සාරධර්ම සපිරි ගුණගරුක සමාජයක් බිහිකිරිමේ ප්‍රමුඛතම පහසුකරන්නා යන දැක්ම ලඟා කරගැනීම අරභයා ඉටු කලයුතු කාර්ය භාරය ක්‍රියාත්මක කිරීම උදෙසා ප්‍රධාන අංශ 05 කින් බුද්ධශාසන අමාත්‍යාංශය සමන්විත වේ.

එනම්,

1) පාලන අංශය
2) සංවර්ධන අංශය
3) ගිණුම් අංශය
4) පූජාභූමි සංවර්ධන අංශය
5) බුද්ධශාසන අරමුදල
6) වයඹ ලේකම් කාර්යාලය

<u>පාලන අංශය</u>

බුද්ධශාසන අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ලඟා කර ගැනිම උදෙසා අමාත්‍යාංශය සතු සමස්ත මානව සම්පත් හා භෞතික සම්පත් කළමණාකරනය හා අධික්ෂණය කිරීමේ කාර්ය භාරය පාලන අංශය මඟින් සිදු කෙරේ. අතිරේක ලේකම් (පාලන හා මුදල්) යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය මඟින් පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

1. අමාත්‍යාංශයේ සියළුම පරිපාලන කටයුතු.
2. මාණ්ඩලික නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ පෞද්ලික ලිපිගොනු නඩත්තු කිරීම.

3. අමාත්‍යාංශය සතු වාහන පරිපාලනය.
4. අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ සියළුම නඩත්තු කටයුතු හා පරිපාලනය.
5. අමාත්‍ය කාර්ය මණ්ඩලය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩල වල සියළුම පරිපාලන කටයුතු හා අනෙකුත් අවශ්‍යතා සපුරාලීම.
6. අමාත්‍යාංශයේ පැවැත්වෙන උත්සව පිළිබඳ කටයුතු කිරීම.
7. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
8. අමාත්‍යාංශයේ සියළුම රාජකාරී දුරකථන බිල්පත් නිරවුල් කිරීම.
9. අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ වරිපනම් හා විදුලි බිල්පත් නිරවුල් කිරීම.
10. අමාත්‍යාංශයේ පවිත්‍රතා කටයුතු හා ආරක්ෂක අංශය පිළිබඳව කටයුතු කිරීම.
11. අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම, අමාත්‍යාංශයට අදාල පනත් සම්බන්ධව කටයුතු කිරීම.
12. වීසා අංශයේ කටයුතු
    - විදේශයන්හි සිට ආගමික කටයුතු සඳහා පැමිණෙන පූජ්‍ය පක්ෂය හා ගිහි පිරිස් සඳහා වීසා නිර්දේශ ලිපි නිකුත් කිරීම.(පැමිණීමේ වීසා, වාස වීසා ලබා දීම හා දීර්ඝ කිරීම සඳහා නිර්දේශ)
    - මෙරට සහ පිට රට වසන ස්වාමින්වහන්සේලා සඳහා වීසා නිර්දේශ ලිපි නිකුත් කිරීම.
    - දඹදිව වන්දනා සංවිධාන ලියාපදිංචි කිරීම.
    - දඹදිව වන්දනා සඳහා වීසා නිර්දේශ නිකුත් කිරීම.
    - දඹදිව වන්දනා සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම.
13. කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය.

<u>සංවර්ධන අංශය</u>

රාජ්‍ය අයවැය ලේඛනයෙන් බෞද්ධාගමේ පුනර්ජීවනය හා සංවර්ධනය උදෙසා ලබා දෙන මුල්‍ය ප්‍රතිපාදනයන් රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව සංවර්ධන වැඩ සටහන්වල ආයෝජනය කිරීම තුලින් සාරධර්ම සපිරි ගුණ ගරුක සමාජයක් බිහිකිරීම සඳහා සැලසුම් කිරීම, අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම සංවර්ධන අංශයේ ප්‍රධාන අරමුණයි. අතිරේක ලේකම් (සංවර්ධන) යටතේ

ක්‍රියාත්මක වන මෙම අංශය මඟින් ඉහත අරමුණු ලඟාකර කර ගැනීම සඳහා පහත සඳහන් කාර්ය භාරයන් ඉටු කරනු ලබයි .

1. අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කෙරෙන විවිධ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් පිළියෙල කිරීම හා අධීක්ෂණය කොට ක්‍රියාත්මක කිරීම.
2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරිම.
3. අමාත්‍යාංශ හා ඊට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතන වල ප්‍රගති සමාලෝචන කටයුතු
4. අමාත්‍යාංශයේ සැලසුම් හා සංවර්ධන විෂයට අදාලව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සැකසීම හා ඒවායේ තීරණ ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු .
5. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන සියළුම දේශීය/ විදේශීය ඉදිකිරීම් ව්‍යාපෘතින්ට අදාල රාජකාරී කටයුතු සම්බන්ධීකරණය මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.
6. ග්‍රන්ථ මුද්‍රණය හා වාර්ෂික දිනපොත් සැකසීම.
7. අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතනයන්හි සංවර්ධන විෂයට අදාල කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
8. අමාත්‍යාංශය හා බාහිර ආයතන ප්‍රමුඛත්වයෙන් ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය.
9. අමාත්‍යාංශයේ වෙබ් අඩවිය ක්‍රියාත්මක කර යාවත්කාලීන ලෙස පවත්වාගෙන යෑම.
10. අමාත්‍යාංශය මඟින් ආගමික සහජීවන සඳහා කෙරෙන විවිධ වැඩසටහන් සම්බන්ධීකරණය කොට ක්‍රියාත්මක කිරීම.
11. අමාත්‍යාංශයේ මාධ්‍ය කටයුතු සම්බන්ධීකරණය.

**<u>පූජාභූමි සංවර්ධන අංශය</u>**

පුරාවිද්‍යාත්මක සාධක සහිත ඓතිහාසික වටිනාකම් වලින් යුක්ත වූ, ප්‍රාදේශීය වශයෙන් එක් එක් ඓතිහාසික පූජනීය ස්ථානයක් විසින් සිදුකරනු ලබන ආගමික හා සමාජීය සේවාවන් පදනම් කරගෙන හඳුනා ගනු ලැබූ ස්ථාන, 1946 අංක 15 දරණ ගෘහ හා ග්‍රාම නිර්මාණ පනත යටතේ ගැසට් මඟින් ප්‍රකාශයට පත්කොට වෙන් කොට දක්වා ඇති පරිදි , පූජා භූමි සංවර්ධනය කිරීම මෙම අංශයෙන් සිදුවේ.

ඒ අනුව ආගමික වැදගත්කම, පුරා විද්‍යාත්මක හා පාරිසරික වැදගත්කම ඓතිහාසික වැදගත්කම, සංස්කෘතික වැදගත්කම, ආර්ථික හා සමාජයීය වැදගත්කම යන කරුණු සැලකිල්ලට ගනිමින් පූජනීය ස්ථාන සංවර්ධනය සඳහා මූලාධාර සැපයීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.

## බුද්ධශාසන අරමුදල

බොදු පිළිවෙත් රකින, සාරධර්ම සපිරි ගුණගරුක, දැහැමි සමාජයක් බිහිකිරීම යන දැක්ම ලඟා කර ගැනීම සඳහා සම්බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාත්මික හා සමාජීය සංවර්ධනයට දායක වෙමින්, විහාරස්ථානයෙහි ප්‍රත්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමෙන් බුද්ධ ශාසනයේ චිර පැවැත්ම වෙනුවෙන් සිය මෙහෙවර ක්‍රියාත්මක කරයි.

ඒ සඳහා පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි.

01. සාමණේර ආයතන පවත්වාගෙන යාම සඳහා මූල්‍යාධාර ලබා දීමේ වැඩසටහන.

02. සාමණේර ආයතන වර්ෂ අවසාන සමාප්ති කිරීමේ පරීක්ෂණය පැවැත්වීම.

03. සම්බුද්ධත්ව ජයන්ති සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය.

04. දිවයින පුරා වැඩ සිටින භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර ලබාදීම.

05. වයස්ගත පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට පැවිදි ජීවිතය සම්බන්ධව ප්‍රායෝගික පුහුණුව ලබාදීම.

06. දිවයින පුරා පිහිටි දුෂ්කර විහාරස්ථාන සඳහා සනීපාරක්ෂක පහසුකම් වෙනුවෙන් ආධාර ලබා දීම.

07. දිවයින පුරා පිහිටි අති දුෂ්කර විහාරස්ථාන සඳහා සංඝාවාස ඉදිකිරීම.

08. චීන භාෂා හා සංස්කෘතික අධ්‍යයන ආයතන පිහිටුවීම.


## වයඹ ලේකම් කාර්යාලය

2015 සැප්තැම්බර් මස 21දින ප්‍රකාශයට පත්කරන ලද අංක1933/13 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදි. වයඹ සංවර්ධන වැඩසටහන සම්බන්ධීකරණය කිරීම සඳහා අංක129, දඹුල්ල පාර, කුරුණෑගල යන ස්ථානයේ වයඹ සංවර්ධන ලේකම් කාර්යාලය පිහිටුවා වයඹ පළාත තුළ ආර්ථික සහ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කෙරෙන අතර 2018 මැයි මස 12 දින ප්‍රකාශයට පත්කරන ලද අංක 2070/56 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් **අභ්‍යන්තර කටයුතු සහ වයඹ සංවර්ධන අමාත්‍යාංශය** ලෙස සංශෝධනයට ලක් විය.

**වයඹ සංවර්ධන අමාත්‍යාංශයේ විෂයයන් හා කාර්යයන්**

1. වයඹ පළාත තුළ ආර්ථික සහ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම, ඊට අදාළව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, සහ ඒවා ක්‍රියාත්මක කිරීම.
2. වයඹ සංවර්ධන වැඩසටහන සම්බන්ධීකරණය සඳහා ලේකම් කාර්යාලයක් පිහිටුවීම.

# සංවිධාන සටහන - බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය



**2018.12.31** වන දිනට අමාත්‍යාංශයේ හා වයඹ සංවර්ධන කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්බන්ධ තොරතුරු

| අනු අංකය | තනතුර | අදාළ සේවය | ශ්‍රේණිය | වැටුප් අංකය | සේවා මට්ටම | අනුමත සංඛ්‍යාව | | | දැනට සිටින සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ථිර | කොන්ත්‍රාත් | වැඩබලන | ස්ථිර | කොන්ත්‍රාත් | වැඩබලන | වෙනත් |
| 1 | ලේකම් | ශ්‍රී.ලං.ප. සේ | විශේෂ | SL4 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 2 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප. සේ | විශේෂ | SL3 | 1 | 3 | 0 | 0 | | 1 | 0 | 0 |
| 3 | ප්‍රධාන මූල්‍ය නිළධාරි | ශ්‍රී.ලං.ග. සේ | | | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප. සේ | I | SL1 | 1 | 2 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| 5 | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප. සේ | I | SL1 | 1 | 2 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| 6 | ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග. සේ | I | SL1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 7 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප. සේ | III | SL1 | 1 | 4 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| 8 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) | ශ්‍රී.ලං.ඉ. සේ. | III/II | SL1 | 1 | 2 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 9 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර. සේ | II/II, II/I | SL1 | 1 | 2 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| 10 | ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග. සේ | II/II, II/I | SL1 | 1 | 2 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 11 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග. සේ | II/II, II/I | SL1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 12 | නීති නිළධාරි | දෙපාර්තමේන්තුගත | III/II | SL1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 13 | සහකාර ලේකම් (කම්කරු | තාවකාලික | | SL1 | | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සබඳතා) | | | | | | | | | | | |
| 14 | පරිපාලන නිළධාරී | රා.ක.ස. සේ | අධි පන් තිය | MN7 | 2 | 2 | 0 | 0 | 1 | 0 | 0 | 1 |
| 16 | භාෂා පරිවර්තක | භා.ප.සේ | | MN6 | 2 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 17 | ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | | | | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 18 | අයවැය සහකාර | | | MN4 | 3 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 19 | තොරතුරු හාසන්නිවේදන තාක්ෂණ නිළධාරී | ශ්‍රී.ලං.තා. සේ | 2 ශ්‍රේණිය II/I | MN6 | 3 | 3 | 0 | 0 | 2 | 0 | 0 | 0 |
| 20 | සංවර්ධන සහකාර | | | MN4 | 3 | 12 | 0 | 0 | 4 | 0 | 0 | 0 |
| 21 | සැළසුම් සහකාර | | | MN4 | 3 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 22 | සංවර්ධන නිළධාරී | ඒකාබද්ධ සේවය | III | MN4 | 3 | 95 | 0 | 0 | 55 | 0 | 0 | 0 |
| 23 | තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තා. සේ | | MN3 | 3 | 5 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 24 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.ස. සේ | I,II,III | MN2 | 3 | 38 | 0 | 0 | 39 | 0 | 0 | 0 |
| 25 | ස්ථාන භාරකරු | රා.කළ.ස. සේ | I,II,III | MN2 | 3 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 26 | පිළිගැනීමේ නිළධාරී | දෙපාර්තමේන්තුගත | | MN1 | | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 27 | කැමරා ක්‍රියාකරු | දෙපාර්තමේන්තුගත | | MT1 | | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 28 | වීඩියෝ කැමරා ක්‍රියාකරු | දෙපාර්තමේන්තුගත | | MT1 | | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 29 | රියදුරු | ඒ.රි.සේ | | PL3 | 4 | 24 | 0 | 0 | 19 | 0 | 0 | 0 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 30 | කැමරා ක්‍රියාකරු සහකාර | දෙපාර්තමේන්තුගත | | PL1 | | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 31 | කාර්යාල සේවක සේවය | කා.සේ.සේ | I,III,SP | PL1 | 4 | 26 | 0 | 0 | 20 | 0 | 3 | 0 |
| 32 | අරක්කැමි | දෙපාර්තමේන්තුගත | | PL2 | 4 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 33 | කම්කරු | දෙපාර්තමේන්තුගත | | PL1 | 4 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| 34 | සනීපාරක්ෂක කම්කරු | දෙපාර්තමේන්තුගත | | PL1 | 4 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| එකතුව | | | | | | 239 | 1 | 0 | 154 | 5 | 3 | 1 |

## බුද්ධශාසන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය

**පිහිටීම -** බුද්ධශාසන අමාත්‍යාංශය (දහම් පාය) අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07.

**වෙබ් අඩවිය -** www. mbs.gov.lk

**දුරකථන අංක - 011 – 2307674**

**ෆැක්ස් අංකය - 011 -2307406**

## ගරු අමාත්‍යතුමාගේ කාර්යාලය

| තනතුරු නාමය | දුරකථන අංකය | ෆැක්ස් අංකය | දිගු අංක |
|---|---|---|---|
| **ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා (බුද්ධශාසන අමාත්‍ය)** | 011 – 2303285 | - | 601 |
| **අසංක සුධීර පෙරේරා මහතා (පෞද්ගලික ලේකම්)** | 011-2303279 | - | 602 |

| තනතුරු නාමය | දුරකථන අංකය | ෆැක්ස් අංකය | දිගු අංක |
|---|---|---|---|
| චන්ද්‍රප්‍රේම ගමගේ මහතා (අමාත්‍ය උපදේශක) | 0112303283 | - | 604 |
| මනෝජ් දඹරගේ මහතා (මාධ්‍ය ලේකම්) | 011-2300511 | 011-2307335 | 605 |
| මහජන සම්බන්ධතා නිළධාරී | 0113071801 | - | 608 |

## අමාත්‍යාංශ නිළධාරීන්ගේ විස්තර

| තනතුරු නාමය | දුරකථන අංකය | ෆැක්ස් අංකය | දිගු අංක | දුරකථන-නිවස |
|---|---|---|---|---|
| ඒ.පී.ජී. කිත්සිරි මහතා<br>මහතා (ලේකම්) | 011-2307430 | 011-2307406 | 400 | 0703501052<br>0773501052 |
| ආර්.පී.ආර්. අමරසිංහ මිය- අතිරේක ලේකම් (පාලන) | 011-2307690 | 011-2307688 | 300 | |
| ජී.එස්.කේ.සිල්වා මහත්මිය (ප්‍රධාන මූල්‍ය නිළධාරී) | 011-2307673 | 0112307691 | 301 | 0716377403 |
| ජී.එන්.මුණවීර මිය (ප්‍රධාන ගණකාධිකාරී) | | 011-2307398 | 303 | 071-8095900 |
| රුචිර විතාන මහතා<br>අධ්‍යක්ෂ (පූජා භූමි) | 011-2303294 | | 207 | 071-0174253 |
| යූ.එස්.කේ. දෙනාවත්ත මිය (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 0112307399 | | 304 | 0714413314 |
| කේ.කේ. චම්පිකා කනේරු මිය.<br>අධක්ෂ (සංවර්ධන) | 011-2307693 | 00112307405 | 406 | 0718179660 |
| ඩබ්.පී.එන්.විජේසිංහ මහතා (ප්‍රධාන අභ්‍යන්තර විගණක) | 011-2307699 | | 212 | 0718107626 |

| තනතුරු නාමය | දුරකථන අංකය | ෆැක්ස් අංකය | දිගු අංක | දුරකථන-නිවස |
|---|---|---|---|---|
| එල්. වී. හෙට්ටිආරච්චි මයා. සහකාර ලේකම් (පාලන) | 011-2303287 | | 307 | 071-7780507 |
| සහකාර ලේකම් (බෞද්ධ කටයුතු) | 011-2307689 | | 302 | පුරප්පාඩු |
| ඩී.එස්. සුනිල් සමරසිංහ මයා පරිපාලන නිලධාරී (වැ.බ.) | 011-2307402 | | 305 | 071-8002919 |
| එස්.කේ.පී. සිරිවර්ධන මයා ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | 011-2307905 | | 410 | 0778579057 |
| බුද්ධශාසන අරමුදල | 011-2679969 | | | |
| රජයේ විගණන අංශය | 011-2307401 | | 250 | |
| රජරට චාරිකා නිවාසය | 026-2226556 | | | |
| තොරතුරු තාක්ෂණ අංශය | 011-2307095 | | 506 | |
| ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය | 011-5769730 | 011-2303295 | | |
| දුරකතන පුවරුව | 011-2307694<br>011-2307674 | | | |
| ඉන්ටර්නෙට් | 011-2307697 | | | |
| සහකාර ලේකම් (කම්කරු සබඳතා) | 011-3100672 | | | |
| ශාසනාරක්ෂක මණ්ඩලය | 011-2307178 | | | |
| බෞද්ධ විශ්වකෝෂය | 011-2679718 | | | |

**2018.12.31** දිනට සේවා මට්ටම අනුව කාර්ය මණ්ඩල සාරාංශය

| සේවා මට්ටම | අනුමත සේවකසංඛ්‍යාව | සේවයේ නියුතු සේවකසංඛ්‍යාව |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 23 | 16 |
| තෘතියික | 3 | 3 |
| ද්විතීයික | 160 | 102 |
| ප්‍රාථමික | 54 | 42 |
| එකතුව | **240** | **163** |

# 2. සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## 2.1 සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය හා භෞතික ප්‍රගති සාරාංශය

2018 වර්ෂයේ රාජ්‍ය අයවැය ලේඛනය මඟින් බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන පූජා භූමි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ (101-2-1 වැය ශීර්ෂය යටතේ) රු.මි. 1065.00 ක ප්‍රතිපාදන ලබා දෙන ලදී. ඒ යටතේ වාර්ෂික ව ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් 05 ක් සඳහා ද විශේෂ ව්‍යාපෘති වශයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් ද අයවැය යෝජනාවක් මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති 01 ක් වෙනුවෙන් ද ප්‍රතිපාදන සළසා දෙන ලදී. ඒ ඒ ව්‍යාපෘති පිළිබඳ විශ්ලේෂණ සහිත දීර්ඝ විස්තර මෙහි පසු ඡේදවල දී විස්තර කෙරේ.

## 2.2 සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

| අංකය | වැඩසටහන | ඇස්තමේන්තු පිරිවැය (රු.මි.) | ව්‍යාපෘතිකාලය(සිට - දක්වා) | මූල්‍ය ප්‍රභවය | මූල්‍යප්‍රගතිය | | භෞතික ප්‍රගතිය 2018 |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 2018 ප්‍රතිපාදන( රු.මි.) | වියදම (2018.12. 31වන දිනට) | |
| 1 | විද්‍යාලංකාර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීම.(අදියර 05) | 1350 | 2005 - 2017 | ශ්‍රීලංකා රජය | 121.0 | 115.49 | V අදියර 100% (සමස්ථ ප්‍රගතිය 90%) |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2 | නේපාලයේ භූමි කම්පාවෙන් හානියට පත් විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම. (ආනන්ද කුටි මහා විහාරය හා රාතෝ මච්චින්ද්‍රනාත් හින්දු කෝවිල) | 450.0 | 2016 - 2018 | ශ්‍රීලංකා රජය | 155.0 | 116.9 | 90% |
| 3 | ශ්‍රී දළදා මාළිගාවට අනුයුක්ත ප්‍රාසාංගික පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම. | 145.0 | 2016 -2019 | ඉන්දියා / ශ්‍රී ලංකා රජය<br>GOSL | 94.0 | 44.58 | 35% |
| 4 | පූජා භූමි සංවර්ධනය කිරීම. | 102.0 | වාර්ෂික වැඩසටහන කි. | ශ්‍රී ලංකා රජය | 102.0 | 101.7 | 100% |
| 5 | ඌණ සංවර්ධිත විහාරස්ථාන සංවර්ධනය කිරීම. | 220.0 | වාර්ෂික වැඩසටහන කි. | ශ්‍රී ලංකා රජය | 220.0 | 198.07 | විහාරස්ථාන 574<br>98.35% |
| 6 | තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන | 50.0 | වාර්ෂික වැඩසටහන කි. | ශ්‍රී ලංකා රජය | 50.0 | 40.0 | ගම්මාන<br>86 |
| 7 | අන්‍ය භාෂා ප්‍රවර්ධනය හා ආගමික සහජීවනය | 5.0 | වාර්ෂික වැඩසටහන කි. | ශ්‍රී ලංකා රජය | 5.0 | 4.42 | වැඩසටහන් 05 |

| අංකය | වැඩසටහන | ඇස්තමේන්තු පිරිවැය (රු.මි.) | ව්‍යාපෘතිකාලය (සිට - දක්වා) | මූල්‍ය ප්‍රභවය | මූල්‍යප්‍රගතිය | | භෞතික ප්‍රගතිය 2018 |
|---|---|---|---|---|---|---|---|
| | | | | | **2018 ප්‍රතිපාදන (රු.මි.)** | **වියදම (2018.12. 31 වන දිනට)** | |
| 8 | ඌණ සංවර්ධන දහම් පාසල් සංවර්ධනය කිරිම. | 140.0 | වාර්ෂික වැඩසටහන කි. | ශ්‍රී ලංකා රජය | 140.0 | 133.51 | දහම් පාසල් 693<br>95% |
| 9 | බෞද්ධ විශ්ව කෝෂය පරිගණකගත කිරීම. | 3.0 | | ශ්‍රී ලංකා රජය | 3.0 | 1.21 | 25% |
| 10 | පුරාණ විහාර ප්‍රතිස්ථාපනය හා ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන | 175.0 | (2018 අයවැය යෝජනා අංක 161) | ශ්‍රී ලංකා රජය | 175.0 | 141.26 | පුරාණ විහාර<br>91<br>95.78% |

(සටහන 01)

## 2.2.1. පූජාභූමි සංවර්ධනය

- හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1933/3 2015 සැප්තැම්බර් 21 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරී ඇති පූජාභූමි සැළසුම්කරණය හා සංවර්ධනය විෂය ප්‍රකාරව නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත් කාලීන සුරක්ෂිත බව පවත්වා ගැනීම සඳහා එම ප්‍රදේශය පූජාභූමියක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත් කෙරේ.

කිසියම් විහාරස්ථානයක් හෝ දේවාලයක් පූජාභූමියක් ලෙස හඳුනාගෙන නම් කොට ගැසට් මඟින් ප්‍රකාශයට පත්කිරීමත් එම පූජාභූමිය සංවර්ධනය කිරීමත් අමාත්‍යාංශයේ කාර්යභාරය වේ. මෙහිලා ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව ද සහාය කරගනු ලැබේ.

**පූජා භූමියක් ප්‍රකාශයට පත් කිරීමේ දී සැළකිල්ලට ලක් කෙරෙන කරුණු**

- ආගමික වැදගත්කම
- ඓතිහාසික වැදගත්කම
- පුරාවිද්‍යාත්මක වැදගත්කම
- සංස්කෘතික වැදගත්කම
- ගෘහ නිර්මාණ ශිල්පීය වැදගත්කම
- පාරිසරික වැදගත්කම
- ආර්ථික හා සමාජයීය වැදගත්කම

**2018.12.31 දිනට පූජා භූමි සංවර්ධන වැය විෂයෙහි ප්‍රාග්ධන වියදම් පිළිබඳ ප්‍රගතිය**



බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පූජා භූමි සංවර්ධන වැඩසටහන සඳහා 2018 වර්ෂයේ ජාතික අයවැය ලේඛනය මඟින් රු.මි. 100 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. මෙම ප්‍රතිපාදනවලින් 2017 වර්ෂයේ මෙම වැඩසටහන යටතේ සිදුකළ සංවර්ධන කාර්යයන් සඳහා නොපිය වූ බිල්පත් වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉල්ලීම පරිදි රු.මි. 16.85 ක් වෙන් කරන ලදී. 2018 වර්ෂයේ රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වීම නිමිති කරගෙන කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය දේවගිරි රජමහා විහාරස්ථානයේ සිදුකළ සංවර්ධන කාර්යයන් වෙනුවෙන් රු.මි. 46.59 ක් ද වෙන්කරන ලදී. මෙම සංවර්ධන කාර්යයන් ත්‍රිවිධ හමුදාවේ ශ්‍රම දායකත්වයෙන් සිදු කරන ලද අතර මූලික සැළසුම් හා ඉදිකිරීම් අධීක්ෂණය සඳහා භෞතික සැළසුම් දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගන්නා ලදී. 2017 වර්ෂයේ නිම කළ පූජා භූමි සංවර්ධන කාර්යයන් ඇතුළු ව සංවර්ධන ව්‍යාපෘති 18 ක් වෙනුවෙන් ප්‍රතිපාදන සළසා ඇති අතර එහි මූල්‍ය ප්‍රගතිය 100% ක් ද භෞතික ප්‍රගතිය සාමාන්‍ය 100% ක් අත්පත් කර ගත හැකි විය.



**පූජා භූමි සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2018**

**2018.12.31දිනටභෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | අනුමතප්‍රතිපාදන රු.මි. | මුළු එකතුව | නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව | 2018.12.31 දිනට වියදම රු.මි. |
|---|---|---|---|---|
| මහනුවර | 2.25 | 2 | 2 | 2.25 |
| මාතර | 2.62 | 1 | 1 | 2.62 |
| අම්පාර | 1.58 | 1 | 1 | 1.58 |
| කුරුණෑගල | 58.97 | 2 | 2 | 58.97 |
| අනුරාධපුරය | 5.00 | 2 | 2 | 5.00 |
| බදුල්ල | 24.56 | 1 | 1 | 24.56 |
| ත්‍රිකුණාමලය | 1.17 | | | 1.17 |
| රත්නපුර | 3.30 | | | 3.30 |
| වෙනත් | 2.25 | | | 2.25 |
| අතැති බිල්පත් | | 9 | 9 | |
| මුළු එකතුව | **101.7** | **18** | **18** | **101.7** |

(සටහන 02)

2016 වර්ෂයේ සිට 2018.12.31 දිනට පූජා භූමි සංවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය

| වර්ෂය | පූජා භූමිසංඛ්‍යාව | ප්‍රකාශයට පත්කළපූජා භූමි සංඛ්‍යාව | 2018.12.31 වන දිනටමුළු පූජා භූමි සංඛ්‍යාව | ආධාර ලබා දුන්පූජා භූමි සංඛ්‍යාව | ප්‍රතිපාදනප්‍රමාණය (රු.මි.) | වියදම 12.31 වනදිනට (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 2016 | 109 | 01 | 110 | 71 | 100.00 | 106.58 |
| 2017 | 110 | 02 | 112 | 73 | 100.00 | 102.17 |
| 2018 | 112 | - | 112 | 09 | 101.7 | 101.70 |

(සටහන 03)

2018 වර්ෂයේ වියදම තුළ 2017 වර්ෂයේ අතැති බිල්පත් පියවීම වෙනුවෙන් වැය වූ රු.මි. 16.84 ද ඇතුළත් ය.

## 2.2.2 කැළණිය විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීම



බෞද්ධ අධ්‍යාපනයේ පුනර්ජීවනය උදෙසා පුරෝගාමී වූ විද්වත් සමූහයට, උපහාරයක් වශයෙන් ද ථෙරවාදී බුදුදහම ලොවට ප්‍රචලිත කිරීමේ බෞද්ධ අධ්‍යාපනික කේන්ද්‍රස්ථානයක් ලෙස ද බෞද්ධ ප්‍රජාවට අවශ්‍ය අධ්‍යාපන පර්යේෂණ හැකියාවන්, පුහුණුවීම් සඳහා අවශ්‍ය පහසුකම් සපයන මධ්‍යස්ථානයක අවශ්‍යතාව ඉටු කිරිම අරමුණු කොටගෙනඅරම්භ කළ විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම, 2005 වර්ෂයේ සිට රජයේ අරමුදල් ආයෝජනය කර ඉදිකර එහි අවසන් අදියරට පැමිණ ඇත.




මෙම නවීන සම්මන්ත්‍රණ ශාලාව තුළ එකවර 1400කට පමණ අසුන්ගත හැකි නවීන අංගෝපාංගයන්ගෙන් සමන්විත ප්‍රධාන ශ්‍රවණාගාරයක්ද ආසන 400 පමණ ධාරිතාවයෙන් යුත් රැස්වීම් ශාලා 02කින්ද සාමාජිකයන් 350කට එකවර රැඳී සිටිය හැකි ප්‍රදර්ශණ ශාලාවකින් සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවක තිබිය යුතු පහසුකම් වලට සමගාමීව වායු සමීකරණ පද්ධති, ගිනිනිවීම්, ආරක්ෂිත පද්ධති, ගබඩා, විශේෂ අමුත්තන්ගේ කුටි, ජලනළ පද්ධති, ජාලකරණ

පද්ධති, පොදු ඇමතුම් පද්ධති, ගිලන් කුටි, සනීපාරක්ෂක පහසුකම් හා අභ්‍යන්තර හා බාහිර රථගාල පහසුකම්වලින්ද සමන්විතය. 2005 වර්ෂයේදී ආරම්භ වූ මෙම ව්‍යාපෘතිය ප්‍රධාන රේඛීය අමාත්‍යාංශ 02 ක් වන නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය හා බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ (පූර්ව බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය ද ඇතුළුව) වසර 13 ක කාලය තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ ඒ අමාත්‍යාංශ විසින් එක් එක් වර්ෂවලදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට දැක්වූ දායකත්වය හා ප්‍රතිපාදන ලැබීම් හා වියදම් තත්ත්වය පහත දැක්වේ.

| අමාත්‍යාංශය | වර්ෂය | භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි. |
|---|---|---|---|
| නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය | 2005 -2012 | 507.30 | 431.72 |
| බුද්ධශාසන හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | | 896.00 | 772.61 |
| බුද්ධශාසන හා සංවර්ධන වයඹ අමාත්‍යාංශය | 2013 | | |
| | 2014 | | |
| | 2015 | | |
| | 2016 | | |
| | 2017 | | |
| | 2018 | | |
| **එකතුව** | | **1403.30** | **1204.33** |

(සටහන 04)

2018 වර්ෂය වන විට ව්‍යාපෘතියේ සංශෝධිත මුළු ඇස්තමේන්තු පිරිවැය රු.මි. 1350 කි. එසේම මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේ සිට බුද්ධශාසන අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර ඇත. 2018 වර්ෂයේ ජූලි මස වන විට පස්වන අදියර අවසාන කිරීම දක්වා මුළු වියදම රු.මි. 1204.33 ක් වන අතර ව්‍යාපෘතියේ පස්වන අදියරේ ඇස්තමේන්තුගත ක්‍රියාකාරකම් වලින් 100% ක ප්‍රගතියක් අත්පත් කරගැනීමට ද මුළු ව්‍යාපෘතියෙන් 90% ක ප්‍රගතියක් අත්කර ගැනීමට ද සමත් වී ඇත. ව්‍යාපෘතියේ 2018.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය සටහන 1 හි 1 යටතේදැක්වේ.





තවද මෙම ව්‍යාපෘතිය කෙටි කාලයක් තුළ නිමකොට එය ව්‍යාපෘති ආරම්භ කිරීමට හේතු වූ අරමුණු මුදුන් පත් කරගැනීමේ අපේක්ෂාවෙන් මෙන්ම ඒ සඳහා වැයකරන ලද ප්‍රාග්ධන ආයෝජනයේ ඵලදායීතාවය උපරිම කර ගැනීම සඳහාත් අමාත්‍ය මණ්ඩල තීරණවල නිර්දේශ පාදක කොටගෙන එහි තිර පැවැත්ම සහතික කිරීම සඳහාත් භාරකාර මණ්ඩලයක් පත්කිරීමට අවශ්‍ය නීතිමය ලියවිලි සැකසීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙහෙයුම් කළමනාකරණය සඳහා කළමනාකරණ මණ්ඩලයක් පිහිටුවීමටත්, එම කළමනාකරණ මණ්ඩලය මගින් ව්‍යාපාරික සැළැස්මක් සකස් කොට මෙම සම්මන්ත්‍රණ ශාලාව සේවා සැපයුම් තත්ත්වයට පත්කොට ආදායම් උත්පාදන ක්‍රියාවලියකට යොමුකිරීමටත්, එම ආදායමින් සම්මන්ත්‍රණ ශාලාවේ මෙහෙයුම්, පරිපාලන හා කළමනාකරණ වියදම් ආවරණය කර ගැනීමටත්, අනතුරුව ඉතිරිවන අතිරික්ත ආදායම විද්‍යාලංකාර පිරිවෙනෙහි නඩත්තු කටයුතු සඳහා යොදාගැනීමටත් අදාළ යෝජනා සහිතභාරඔප්පුවක් කෙටුම්පත් කර ඇත. මෙම යෝජනා ඇතුළත්ව කෙටුම්පත් කරන ලද භාර ඔප්පුව නීති උපදෙස් සඳහා යොමුකිරීමට නියමිතය.
මෙම ව්‍යාපෘතියේ මූලික අදියර ලෙස ප්‍රධාන ශ්‍රවණාගාරය 2019 වර්ෂයේ සිට සේවා සැපයීම් සඳහා විවෘත කිරීමේ ක්‍රමවේදයකට අවතීර්ණ වී ඇත.

## 2.2.3. ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන

2018 වර්ෂයේ ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන තුන් අවුරුදු සැළැස්මක් මත පදනම් ව ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරන ලදී. ඒ අනුව සෑම දිස්ත්‍රික්කයක ම පිහිටි සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ම ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධන යෝජනා 02 ක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලදී. විහාරස්ථාන දහම් පාසල් තේරීමේ දී ශාසනාරක්ෂක බල මණ්ඩලයේ අනුමැතිය මත තෝරාගන්නා දහම් පාසල් යෝජනා ප්‍රමුඛතා ගත කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

දහම් පාසල් සංවර්ධන යෝජනා තෝරා ගැනීමේ දී පහත සඳහන් නිර්ණායක පදනම් කර ගෙන ප්‍රමුඛතා ගත කෙරේ.

I. භූමියේ අයිතිය ඇති, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි දහම් පාසලක් වීම.
II. පසුගිය වසර 02 තුළ වෙනත් ප්‍රභවයකින් ආධාර ලබා නොතිබීම.
III. ගොඩනැගිලි අවශ්‍යතාවක දී දහම් පාසල් ගොඩනැගිල්ලේ හෝ ධර්ම ශාලාවේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව සිසුන් සංඛ්‍යාව අනුව තහවුරු වීම.
IV. දහම් පාසල් පුටු / මේස හා වෙනත් උපකරණ ප්‍රමාණවත් නොවීම.
V. දහම් පාසල් සිසුන්ට ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොතිබීම.

ඒ අනුව 2018 වර්ෂය තුළ අමාත්‍යාංශය වෙත මෙම වැඩසටහන සඳහා සංවර්ධන යෝජනා විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වූ අතර, ඒ අතරින් කමිටුවේ නිර්දේශ මත සංවර්ධන යෝජනා 693 ක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී දිස්ත්‍රික් ලේකම්වරු වෙත ක්‍රියාත්මක කිරීම සඳහා යවා ඇත.




සාසනෝදය දහම් පාසල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම

## ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය - 2018.12.31 දිනට ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | අනුමත ප්‍රතිපාදන රු.මි. | ව්‍යාපෘති සංඛ්‍යාව | නිම කළ ව්‍යාපෘති මුළුඑකතුව | 2018.12.31 දිනට වියදම රු.මි. | 2018.12.31 දිනට අතැති බිල් පත් (රු.මි) |
|---|---|---|---|---|---|
| ගාල්ල | 10.6 | 54 | 51 | 10.29 | 0.58 |
| ත්‍රිකුණාමලය | 0.5 | 4 | 3 | 0.52 | |
| නුවරඑළිය | 2.2 | 13 | 11 | 2.13 | |
| පුත්තලම | 5.07 | 29 | 29 | 4.76 | |
| පොළොන්නරුව | 2.18 | 12 | 11 | 2 | |
| බදුල්ල | 5.9 | 38 | 38 | 5.46 | |
| මඩකළපුව | 0.3 | 2 | 2 | 0.3 | |
| මහනුවර | 10.53 | 57 | 54 | 10.72 | |
| මාතර | 7.5 | 39 | 35 | 7.08 | |
| මොණරාගල | 4.7 | 23 | 23 | 4.57 | |
| රත්නපුර | 5.9 | 36 | 36 | 5.66 | 0.4 |
| වව්නියාව | 1 | 5 | | 1 | |
| හම්බන්තොට | 3.3 | 21 | 20 | 3.93 | |
| අනුරාධපුරය | 10.1 | 53 | 49 | 9.73 | 1 |
| අම්පාර | 3.5 | 19 | 17 | 3.46 | |
| කළුතර | 8.8 | 39 | 36 | 7.28 | 1.08 |
| කෑගල්ල | 6.4 | 38 | 28 | 5.11 | 0.96 |
| කොළඹ | 5.7 | 32 | 30 | 5.39 | |
| ගම්පහ | 6 | 33 | 33 | 6.13 | |
| කුරුණෑගල | 34.41 | 156 | 156 | 33.48 | 0.83 |
| **මුළුඑකතුව** | **139.4** | **729** | **693** | **133.51** | **4.87** |

(සටහන 05)

2015 – 2018 වර්ෂවල දහම් පාසල් සංවර්ධනය සඳහා ලබාදුන් ප්‍රතිපාදනවල ප්‍රගතිය පහත දැක්වේ.

| වර්ෂය | දිස්ත්‍රික්ක | ප්‍රතිපාදන (රු. මි.) | දහම් පාසල් සංඛ්‍යාව | වියදම(රු.මි.) (2018.12.31 දිනට) |
|---|---|---|---|---|
| 2015 | 17 | 90.00 | 853 | 90.00 |
| 2016 | 19 | 90.00 | 678 | 97.82 |
| 2017 | 21 | 100.00 | 678 | 99.99 |
| 2018 | 21 | 140.00 | 693 | 133.51 |

(සටහන 06)

2018 වර්ෂයේ ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා රාජ්‍ය අයවැය ලේඛණය මඟින් රුපියල් මිලියන 140 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි.ඒ අනුව 2018.12.31 දින වන විට දිස්ත්‍රික්ක 21 ක ව්‍යාප්ත වී ඇති ප්‍රමුඛතා අනුව හඳුනාගත් දහම් පාසල් 729 කට දහම් පාසල් ගොඩනැඟිලි සහ උපකරණ සඳහා ලබාදීමට රු.මි. 133.51 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. මේ වන විට ක්‍රියාත්මක කරන ලද දහම් පාසල් සංවර්ධන යෝජනා සංඛ්‍යාව693 කි. කෙසේ වුවද පූර්ව වර්ෂය සමඟ සාපේක්ෂ ව සසඳා බලන කළ ඌණ සංවර්ධිත දහම් පාසල් සංවර්ධනය සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය 40% කින් වැඩි කිරීමට හැකි වී ඇත.

## 2.2.4. ඌණ සංවර්ධිත විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන

2018 ඌණ සංවර්ධිත විහාරස්ථාන සංවර්ධන වැඩසටහන ද තුන් අවුරුදු සැළැස්මක් මත ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන ඇත.

2018 වර්ෂයේදී ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලවල අනුමැතිය මත සුදුසු විහාරස්ථාන සංවර්ධන යෝජනා 02 ක් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින්ම ලබා ගැනීමට සැලසුම් කරන ලදී. එහිදී වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණය, වසරේ පැවැත්වෙන රාජ්‍ය වෙසක් උත්සවය සඳහා වූ වියදම්, සංවර්ධන අවශ්‍යතාවයේ ස්වභාවය හා ප්‍රදේශයට දක්වන ශාසනික දායකත්වය ද සලකා බලා එම කමිටුව මඟින් පහත නිර්ණායක මත පදනම්ව සංවර්ධන යෝජනා තේරීම සිදු කරඇත.

මෙම යෝජනා,අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් තෝරා ගැනීමේ කටයුතු පහත නිර්ණායකයන්ට යටත් ව සිදුකරන ලදී.

i. භූමියේ අයිතිය ඇති බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විහාරස්ථානයක් හෝ දසසිල් මාතා ආරාමයක් වීම.
ii. පසුගිය වසර 02 තුළ වෙනත් ප්‍රභවයකින් ආධාර ලබා නොතිබීම.
iii. ජල පහසුකම් විදුලිය හා ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් නොමැති වීම.
iv. විහාරස්ථ භික්ෂූන් වහන්සේලාට/ සිල්මාතාවන්ට ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හා පවතින ගොඩනැඟිලි තාවකාලික හෝ අර්ධ ස්ථිර තත්ත්වයක් පැවතීම.
v. ප්‍රමාණවත් දාන ශාලාවක් නොවීම.







මේ අනුව 2018 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 21 ක් තුළ පිහිටි විහාරස්ථාන 574 ක් සඳහා රු. මි.220.7ක ප්‍රතිපාදන අනුමත කර ඇත. ඉන් 2018.12.31 දින වන විට දිස්ත්‍රික් මට්ටමින් ප්‍රතිපාදන නිදහස් කිරීම්වල භෞතික හා මූල්‍ය ප්‍රගති තත්ත්වය සටහන (7) හි දැක්වේ. ඒ අනුව 2018.12.31දිනට විහාරස්ථාන සංවර්ධන යෝජනා 574 ක් වෙනුවෙන් රු.මි. 220.6 ක් ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කර ඇත. තවද 2017 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් නොපිය වූ හිඟ බිල්පත් ආවරණය කිරීමසඳහා කරන ලද ඉල්ලීම අනුව රු.මි. 9.35 ක් ද ස්වභාවික ආපදා නිසා හානියට පත් විහාරස්ථාන නඟා සිටුවීම සඳහා රු.මි.41.12ක් ද වෙන් කරන ලදී.

ඌණ සංවර්ධිත විහාරස්ථාන සංවර්ධනය - 2018.12.31 දිනට ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | අනුමත ප්‍රතිපාදන (රු.මි.) | ව්‍යාපෘති සංඛ්‍යාව | 2018.12.31 දිනට වියදම(රු.මි.) | 2018.12.31 දිනට අතැති බිල් පත් (රු.මි.) |
|---|---|---|---|---|
| කොළඹ | 8.53 | 18 | 8.12 | - |
| ගම්පහ | 5.32 | 13 | 5.27 | - |
| කළුතර | 7.36 | 23 | 4.55 | 2.86 |
| මහනුවර | 9.53 | 27 | 9.78 | - |
| මාතලේ | 4.27 | 17 | 4.26 | - |
| නුවරඑළිය | 2.8 | 10 | 2.78 | - |
| ගාල්ල | 12.82 | 25 | 11.63 | 0.97 |
| මාතර | 20.27 | 20 | 18.94 | - |
| හම්බන්තොට | 3.91 | 14 | 4.34 | 0.49 |
| වව්නියාව | 0.6 | 2 | 0.6 | - |
| මඩකළපුව | 1.2 | 4 | 1.2 | - |
| අම්පාර | 3.11 | 12 | 2.96 | - |
| ත්‍රිකුණාමලය | 2.1 | 7 | 2.1 | - |
| පුත්තලම | 3.34 | 11 | 3 | - |

| | | | | |
|---|---|---|---|---|
| අනුරාධපුරය | 9.01 | 32 | 7.02 | 1.74 |
| **දිස්ත්‍රික්කය** | **අනුමත ප්‍රතිපාදන (රු.මි.)** | ව්‍යාපෘති සංඛ්‍යාව | **2018.12.31** දිනට වියදම(රු.මි.) | **2018.12.31** දිනට අතැති බිල් පත් (රු.මි.) |
| පොළොන්නරුව | 3.2 | 11 | 3.79 | 0.24 |
| බදුල්ල | 5.03 | 18 | 4.91 | - |
| මොණරාගල | 3.49 | 12 | 3.47 | - |
| රත්නපුර | 32.3 | 27 | 28.63 | 1.56 |
| කෑගල්ල | 13.03 | 35 | 10.37 | 2.08 |
| කුරුණෑගල | 69.49 | 236 | 60.35 | 8.36 |
| **මුළු එකතුව** | **220.69** | **574** | **198.07** | **18.32** |

(සටහන 07)

2015 සිට 2018 දක්වා ඌණ සංවර්ධිත විහාරස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහනේ ප්‍රගතිය

| වර්ෂය | දිස්ත්‍රික්ක සංඛ්‍යාව | ප්‍රතිපාදන (රු.මි.) | විහාරස්ථාන සංඛ්‍යාව | වියදම (රු.මි.) (2018.12.31දිනට) |
|---|---|---|---|---|
| 2015 | 18 | 52.06 | 240 | 52.06 |
| 2016 | 23 | 122.56 | 488 | 122.56 |
| 2017 | 21 | 100.00 | 434 | 105.48 |
| 2018 | 21 | 220 .69 | 574 | 198.07 |

(සටහන 08)

පූර්ව වර්ෂ හා සංසන්දනය කර බලන විට ඌණ සංවර්ධිත විහාරස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන වෙනුවෙන් අමාත්‍යාංශය වෙන් කළ ප්‍රතිපාදනවල වැඩිවීමක් පෙන්නුම් කරන අතර එය 2017 වර්ෂයට සාපේක්ෂ ව120% ක වැඩිවීමක් පෙන්වයි.

## 2.2.5. තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන







දරිද්‍රතාවයෙන් හා ණය බරින් මිදී නිසි පෝෂණයෙන් සපිරි, , මතින් හා අවසිහියෙන් තොර සෞඛ්‍ය සම්පන්න දිවි පෙවෙතක් ගත කරන, සියලු ආකාරයේ හිංසන ක්‍රියාවන්ගෙන් වියුක්ත , ආධ්‍යාත්මීය වශයෙන් උසස් මනසක් සහිත , යහපැවැත්මෙන් හා දියුණු පෞරුෂයෙන් හෙබි දැනුමින් පිරිපුන් මානව සම්පත් සපිරි ගමක් " පුණ්‍යග්‍රාමයක් ලෙස හැඳින්විය හැකිය. බෞද්ධාගම සුරක්ෂිත කොට පෝෂණය කරනු වස් අතීත ගමයි පන්සලයි යන සංකල්පය ග්‍රාමීය ප්‍රජාව තුළ ජනිත කිරීම තුළින් යහපත් ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදීමට අවශ්‍ය වන්නා වූ බෞද්ධාගමික ඉගැන්වීම් හා එම ක්‍රියාකාරකම්වල යෙදීමට අවශ්‍ය වන්නා වූ දිරිගැන්වීම් ලබාදීම මෙම වැඩසටහව තුලින් අපේක්ෂා කරනු ලබයි. සම්පත් පරිභෝජනයේ දී සමානාත්මතාවය ඇති කිරීමත් ඒ තුළින් පුද්ගලයා, පවුල හා ගම සුරක්ෂිත කිරීමත් තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහනේ අරමුණ යි.

මේ සඳහා විහාරස්ථාන කේන්ද්‍ර කර ගෙන සාරධර්ම සුරැකීමේ ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් හා භෞතික හා ආර්ථික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කරනු ලබයි. සාරධර්ම සපිරි , ආර්ථිකමය වශයෙන් ශක්තිමත් ගමක් බිහිකිරීම උදෙසා අඩු පහසුකම් සහිත දුෂ්කර විහාරස්ථාන ද එකී ගම්මාන ද සංවර්ධනය කරමින්,ගම්මානවල ජනතාව ගමේ පන්සල් සමඟ ඒකාබද්ධ කර සාරධර්මවලින් පිරිපුන් සමාජයක් බිහිකිරීමට බුද්ධශාසන අමාත්‍යාංශය මඟින් 2018 වර්ෂයේ තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරන ලදී.

➢ තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් හා අරමුණු

1. සාර්ධර්ම සුරැකීමේ වැඩසටහන

   - බෞද්ධාගම මූලික කොටගත් සමාජ සාරධර්ම ආරක්ෂා කිරීම පිණිස සහය වෙමින් සෞඛ්‍ය සම්පන්න හා ආර්ථිකමය වශයෙන් ශක්තිමත් ජනතාවක් බිහි කිරීම.

   - අයහපත් සමාජ විරෝධී ක්‍රියාවන් සමාජගත වීමේ නැඹුරුව අවම කිරීම පිණිස සහය වීම.

   - දෙමාපිය හා දූ දරුවන් අතර යහපත් සබඳතාවක් ගොඩනැගීම පිණිස ක්රියාකාරී පාර්ශවකරුවෙකු වශයෙන් ක්‍රියා කිරීම.

   - දෛනික සමාජ ක්‍රියාකාරකම්වල දී විහාරස්ථාන, භික්ෂූන් වහන්සේගේ සහභාගීත්වය යහපත් මට්ටමකට ගෙන ඒම සඳහා සහය වීම.

   - ආගමික ක්‍රියාකාරකම්වලට පමණක් සීමා නො වූ පුළුල් සමාජ ක්‍රියාකාරකම් සඳහා භික්ෂූන් වහන්සේගේ ක්‍රියාකාරී නායකත්වය ලබා දීම පිණිස වැඩ පිළිවෙළක් හඳුන්වා දීම.

2. විහාරස්ථාන කේන්ද්‍ර කොටගත් භෞතික හා ආර්ථික සංවර්ධන වැඩසටහන

   - විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් සංවර්ධනය කළ හැකි ග්‍රාමීය ආර්ථික ක්‍රමයක් ගොඩනැඟීම පිණිස සහය වීම.

   - ස්ත්‍රීන් විදේශගත වීම, ළමා ශ්‍රමය වැනි සමාජ අවගමනයට හේතු වන ආර්ථික ක්‍රියාකාරකම් මඟහරවමින් ග්‍රාමීය ආර්ථිකය ඵලදායී ලෙස හැසිරවීමට ආර්ථික උපාය මාර්ග සකස් කිරීමට අවශ්‍ය නායකත්වය විහාරස්ථාන තුළින් සැපයීම පිණිස සුදුසු ක්‍රියාවලියක් හඳුන්වා දීම.

   - විහාරස්ථානයේ ග්‍රාමීය ජනතාවට ප්‍රයෝජන ගැනීම පිණිස පොදු ගොඩනැගිල්ලක් සංවර්ධනය කිරීම.

   - ආර්ථික කාර්යයන්ට සහය වීමට උපයෝගී කරගෙන, හැකි පරිදි විහාරස්ථානය කේන්ද්‍ර කොටගත් ග්‍රාමීය දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.

මෙම වැඩසටහන සඳහා 2018 අයවැය ලේඛනය මඟින් රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන වෙන් ව තිබුණු අතර,පෙර වර්ෂයේ සෑම දිස්ත්‍රික්කයකින් ම අඩු පහසුකම් සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතරින් අවම සමාජ, ආර්ථික පසුතලයන් වාර්තා කරන ගම්මාන 02 බැගින් හඳුනාගෙන එම ගම්මාන සමාජ සාරධර්ම සමඟ ආර්ථික වශයෙන් ශක්තිමත් වූ ප්‍රජාවක් වෙසෙන පුණ්‍යග්‍රාමයක් බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාවට නැංවීමට සැළසුම් කරන ලදී.

ඒ අනුව ඒ ඒ ගම්මානවල පවතින සමාජ, ආර්ථික සංවර්ධනයට ප්‍රබල බාධකයක් වන ගැටලුවලට පිළියම් ලැබෙන පරිදි ව්‍යාපෘති සැළසුම් කිරීමේ වගකීම හා පුහුණුව ග්‍රාමීය කමිටුවට හා පශීය කමිටුවට පවරා ඇත. ඒ අනුව හඳුනාගත් ගම්මානවල මත්ද්‍රව්‍ය, සමාජ විරෝධී ක්‍රියා, ළමා හා කාන්තා

හිංසන පිටුදකිමින් පුහුණු හා ආධ්‍යාත්මික සංවර්ධන ව්‍යාපෘති ද ප්‍රජාවගේ ජන ජීවිතය සවිබල ගැන්වීමට උර දෙන්නා වූ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති ද කේන්ද්‍ර වූ විහාරස්ථාන සඳහා භෞතික සංවර්ධන යෝජනාවන් ද ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2018.12.31 දින වන විට දිස්ත්‍රික්ක 22ක් වෙතින් ගම්මාන 53 ක් සඳහා භෞතික සංවර්ධන යෝජනා 53 ක් ද සාර්ධර්ම හා ආර්ථික සංවර්ධන යෝජනා 87 ක් ද ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන සළසා දෙන ලදී.

2018 වර්ෂයේ තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන සඳහා දිස්ත්‍රික් මට්ටමින් පහත පරිදි ප්‍රතිපාදන සළසා ඇත.

## තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන - 2018.12.31 දිනට ප්‍රගතිය

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ගම්මාන ගණන | ආධ්‍යාත්මික හා ආර්ථික සංවර්ධන වැඩසටහන් ගණන | භෞතික සංවර්ධන වැඩසටහන් ගණන | **2018.12.31 දිනට මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි)** | **2018.12.31 දිනට මුළු වියදම (රු.මි)** | **2018.12.31 දිනට අතැති බිල් පත්** |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 4 | 4 | 36 | 6 | 2.36 | 2.06 | |
| 2 | ගම්පහ | 5 | 5 | 82 | 7 | 1.86 | 1.76 | |
| 3 | කළුතර | 4 | 4 | 42 | 7 | 2.36 | 2.30 | |
| 4 | මහනුවර | 4 | 4 | 59 | 6 | 1.71 | 1.71 | |
| 5 | මාතලේ | 4 | 4 | 69 | 4 | 1.66 | 1.57 | |
| 6 | නුවරඑළිය | 4 | 4 | 64 | 6 | 1.58 | 1.54 | |
| 7 | ගාල්ල | 4 | 4 | 54 | 7 | 1.93 | 1.60 | 0.22 |
| 8 | මාතර | 4 | 4 | 39 | 6 | 1.42 | 1.40 | |
| 9 | හම්බන්තොට | 4 | 4 | 46 | 6 | 2.59 | 2.47 | |
| 10 | මන්නාරම | 3 | 3 | 22 | 1 | 0.56 | 0.56 | |
| 11 | වවුනියාව | 1 | 4 | 18 | 6 | 2.70 | 1.18 | |
| 12 | මුලතිව් | 1 | 4 | 29 | 6 | 2.07 | 2.01 | |
| 13 | අම්පාර | 4 | 4 | 56 | 6 | 1.58 | 1.50 | |
| 14 | ත්‍රිකුණාමලය | 3 | 3 | 22 | 4 | 0.86 | 0.86 | |
| 15 | කුරුණෑගල | 7 | 7 | 63 | 14 | 5.73 | 5.20 | 0.40 |
| 16 | පුත්තලම | 4 | 4 | 73 | 6 | 1.79 | 1.78 | |
| 17 | අනුරාධපුරය | 4 | 4 | 36 | 7 | 2.46 | 1.24 | 1.10 |
| 18 | පොළොන්නරුව | 4 | 4 | 72 | 6 | 2.26 | 1.65 | 0.60 |
| 19 | බදුල්ල | 4 | 4 | 39 | 6 | 1.60 | 1.47 | |
| 20 | මොණරාගල | 4 | 4 | 42 | 6 | 2.04 | 1.98 | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 21 | රත්නපුර | 4 | 4 | 51 | 6 | 1.70 | 1.49 | |
| 22 | කෑගල්ල | 4 | 4 | 46 | 6 | 1.51 | 1.41 | |
| 23 | පූජා භූමි - මොරවැව සිරි ගජබා ගල්ලෙන් රජමහාවිහා රස්ථානයේ ජල ව්‍යාපෘතිය | | | | 1 | | | |
| | **එකතුව** | **84** | **90** | **1060** | **136** | **44.31** | **38.71** | **2.32** |
| **දහම් පාසල් පොත්කට්ටල සඳහා** | | | | | | **0.96** | | |
| **එකතුව** | | | | | | **45.26** | **40.03** | |

(සටහන 09)

ඒ අනුව දිවයින පුරා දිස්ත්‍රික්ක 22 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 84 ක පිහිටි ගම්මාන 90 ක ආධ්‍යාත්මික හා ආර්ථික වැඩසටහන් 1060 ක් ද භෞතික යටිතල පහසුකම් සංවර්ධන යෝජනා 136 ක් ද ක්‍රියාත්මක කරන ලදී.

ඒ සඳහා රු.මි. 45.26 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර එය මුළු ප්‍රතිපාදනයෙන් 94% කි. 2018.12.31 දිනට වියදම රු.මි. 40.0 කි.

තවද මෙම වැඩසටහනේ සමාරම්භක වැඩසටහන් අමාත්‍යාංශයේ නිළධාරීන්ගේ සෘජු අධීක්ෂණයෙන් මොණරාගල, මාතර, කොළඹ, මාතලේ, අනුරාධපුර, පුත්තලම දිස්ත්‍රික්කවල මේ වන විටත් ආරම්භ කර ඇත.

මෙම ගම්මානවල සමාජ, ආර්ථික පසුතලයන් පිළිබඳ දත්ත රැස්කිරීමක් සිදු කරන ලද අතර, එම දත්ත පදනම් කරගෙන ප්‍රගතිය හා පසු විපරම් වාර්තා වසර 03 ක් තුළ අඛණ්ඩ ව පවත්වාගෙන යාමටත්, ඉදිරි වර්ෂ දෙක තුළ දී එම ගම්මානවල යහපත් සමාජ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය විමසා බැලීමටත් අපේක්ෂිත ය.

**2016 සිට 2018 දක්වා තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහනේ ප්‍රගතිය**

| වර්ෂය | දිස්ත්‍රික්ක සංඛ්‍යාව | ප්‍රතිපාදන (රු.මි.) | ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම (රු.මි.) (2018.12.31 දිනට) |
|---|---|---|---|---|
| 2016 | 05 | 24.00 | 15 | 22.08 |
| 2017 | 21 | 24.00 | 78 | 18.20 |
| 2018 | 22 | 50.00 | 1196 | **40.00** |

(සටහන 10)

## 2.2.6. පුරාණ විහාර ප්‍රතිස්ථාපනය හා ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන

අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - 2018 වර්ෂයේ මහා භාණ්ඩාගාරය විසින් අයවැය යෝජනා අංක 161 මඟින් පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත පුරාණ රජමහා විහාරස්ථාන සහ වන්දනාමාන ස්ථාන ප්‍රතිස්ථාපනය හා ප්‍රතිසංස්කරණය වෙනුවෙන් රු.මි. 250 ක් වෙන් කර තිබුණි. මෙම යෝජනාව යටතේ බුද්ධශාසන අමාත්‍යාංශයට රු.මි. 175 ක ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය මට්ටමේ ආයතන සමග සාකච්ඡා කොට ගත් තීරණයට අනුව මෙම වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබාගන්නා සංවර්ධන යෝජනා මඟින් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරන ලදී. මෙහි දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත ලබාගන්නා මෙම සංවර්ධන කාර්යයන්ගේ අධීක්ෂණය සහ මඟපෙන්වීම ද එම දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

**පුරාණ විහාර ප්‍රතිස්ථාපනය හා ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන - 2018.12.31 වන දිනට ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | අනුමත ප්‍රතිපාදන රු.මි. | මුළුඑකතුව | 2018.12.31 දිනට වියදම රු.මි. | 2018.12.31 දිනට අතැති බිල් පත් රු.මි. |
|---|---|---|---|---|
| කොළඹ | 6 | 3 | 5.75 | - |
| ගම්පහ | 12.5 | 5 | 11.35 | |
| කළුතර | 6 | 3 | 4.85 | 1.09 |
| මහනුවර | 8.3 | 7 | 7.3 | - |
| මාතලේ | 9.3 | 5 | 8.56 | - |
| නුවරඑළිය | 9.4 | 5 | 9.29 | - |
| ගාල්ල | 10.15 | 5 | 7.18 | 2.88 |
| මාතර | 7.4 | 5 | 7.26 | - |
| හම්බන්තොට | 2.69 | 3 | 0.76 | 1.94 |
| වව්නියාව | 6 | 3 | 6 | - |
| මඩකළපුව | 2 | 1 | 2 | - |
| අම්පාර | 5.2 | 6 | 4.9 | - |
| ත්‍රිකුණාමලය | 8 | 5 | 7.61 | - |

| | | | | |
|---|---|---|---|---|
| පුත්තලම | 6 | 3 | 5.98 | - |
| අනුරාධපුරය | 16 | 6 | 6.5 | 7.94 |
| පොළොන්නරුව | 5.15 | 3 | 1.35 | 2.93 |
| බදුල්ල | 7.95 | 4 | 7.78 | - |
| මොණරාගල | 10 | 5 | 9.94 | - |
| රත්නපුර | 4 | 2 | 0.03 | 3.95 |
| කෑගල්ල | 9.5 | 5 | 8.18 | - |
| යාපනය | 2 | 1 | | - |
| මුලතිව් | 6.28 | 3 | 1.76 | 2.23 |
| මන්නාරම | 0.5 | | 0.5 | |
| කුරුණෑගල | 9.5 | 6 | 5.96 | 3.39 |
| ශ්‍රී ලංකා යුධ හමුදාව | | | 10.46 | |
| **මුළු එකතුව** | **169.82** | **91** | **141.25** | **26.35** |

(සටහන 11)

2018 වර්ෂයේ මෙම සංවර්ධන වැඩසටහන මඟින් ලබා දී ඇති ප්‍රතිපාදනවල භෞතික හා මූල්‍ය ප්‍රගති තත්ත්වය පහත සටහන මඟින් දැක්වේ.

)

2018.12.31දිනට ප්‍රාදේශීය මට්ටමින් පුරාණ විහාරස්ථාන සංවර්ධන යෝජනා 126 ක් ලැබුණු අතර, පුරාවිද්‍යා නිර්දේශ මත ක්‍රියාත්මක කිරීම සඳහා දිවයින පුරා දිස්ත්‍රික්ක 24 ට ම අදාළ වන පරිදි ව්‍යාපෘති 91 ක් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 176.33 ක් ලබා දී ඇත







## 2.2.7. ආගමික සහජීවනය වැඩසටහන සහ අන්‍ය භාෂා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

### 2.2.7.1 ආගමික සහජීවනය වැඩසටහන

➢ හැඳින්වීම

සෑම ආගමක් තුළින් ම රටක සදාචාරාත්මක සංවර්ධනය සඳහා මහඟු මෙහෙවරක් ඉටු කරනු ලබයි.ආගමික දර්ශනයන් තුළින් රටක ජනතාවගේ ලෞකික සංවර්ධනය මෙන් ම ආධ්‍යාත්මික සංවර්ධනය ද සාක්ෂාත් කර ගත හැකි වේ. ශ්‍රී ලංකාව බහු ආගමික හා බහු ජාතික ජන කොටස් ජීවත් වන රටක් ලෙස තම අනන්‍යතාවය රැක ගනිමින් කිසිදු භේදයකින් තොර ව එක් ව නැඟී සිටීම රටේ ඉදිරි සංවර්ධන ක්‍රියාවලියට බෙහෙවින් වැදගත් වේ. ආගම් මඟින් අපට උගන්වන්නේ බෙදීම වෙනුවට එකතු වීම, එකිනෙකාට ගරු කිරීම, එකිනෙකා ඉවසීම යනාදිය වේ. මේ සඳහා ආගමික පදනම මුල් කරගැනීම සඳහා සියලු ආගම් පිළිබඳ අවබෝධයක් ලබා ගත යුතුය.සියලු ම ආගමික දර්ශන දැනගැනීම මනුෂ්‍යයන් තුළ යහපත් සිතිවිලි ඇති කිරීමට ඉවහල් වන අතර, එය වචනය හා ක්‍රියාව යහපත් වූ සුචරිතවත් සමාජයක් ගොඩනැගීමට ඉවහල් වේ. ඒ සඳහා සියලු ආගම්වල හරයන්

හා සංස්කෘතිකාංගයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාදීම සහජීවනය වර්ධනය කිරීමට හා ගැටුම් අවම කර ගැනීමට හේතුවනු ඇත.අනවබෝධය තුරන් වනු ඇත. දහම් පාසල් දරුවන්, ගුරුවරුන් හා දෙමාපියන් සහභාගී කර ගනිමින් සියලු ආගම් පිළිබඳ සත්‍ය අවබෝධයක් ලබා දීම අරමුණු කරගෙන බුද්ධශාසන අමාත්‍යාංශය මඟින් ආගමික සහජීවන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇති අතර, එය ජාතික හා ආගමික සංහිඳියාව ප්‍රවර්ධනයට මහඟු පිටිවහලක් වනු ඇත.





➢ අරමුණු

සියලු ආගම් පිළිබඳ අන්‍යෝන්‍ය අවබෝධය වැඩිදියුණු කිරීම හා අනවබෝධය නිසා ඇතිවන ගැටලු නිරාකරණය කිරීම තුළින් ආගමික සංහිඳියාව ප්‍රවර්ධනය

➢ ඉලක්ක කණ්ඩායම්

සියලු ආගම්වල දහම් පාසල් දරුවන්, ගුරුවරුන් හා දෙමාපියන්.

➢ ආගමික සහජීවන වැඩසටහනේ ක්‍රියාකාරකම් සහ ක්‍රියාත්මක ක්‍රමවේද

- ගෞරවණීය ස්වාමීන් වහන්සේලා ඇතුළු නායකයින් හා ආරාධිත අමුත්තන්,දහම් පාසල් ගුරුවරුන් හා දහම් පාසල් දරුවන්, නිළධාරීන් සහභාගී වන උත්සව සභාවක් පැවැත්වීම.
- ඔවුනොවුන් හඳුනාගෙන දරුවන්ට, දරුවන් ද දෙමාපියන්ට, දෙමාපියන් ද ගුරුභවතුන් ද වශයෙන් හඳුන්වා දී ඒ ඒ ආගමික සංස්කෘතීන්, සිරිත් විරිත් අන්‍යෝන්‍ය ගෞරවය සුරැකෙන පරිදි හඳුනා ගැනීම.
- ආගමික වතාවත්වල නිරත වීම හා ආගමික ස්ථාන (විහාරස්ථානයක්, හින්දු කෝවිලක්, මුස්ලිම් දේවස්ථානයක්, ක්‍රිස්තියානි පල්ලියක්) නැරඹීම.
- සංස්කෘතිකමය ක්‍රීඩා
- අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩනැංවීමට අදහස් හා ආගමික දැනුම හුවමාරු වැඩසටහන්

**2018 වර්ෂයේදී පහත සඳහන් පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.**

2018.12.31දිනට වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය සටහන 1 හි 7 මඟින් දැක්වේ.

| දිස්ත්‍රික්කය | ක්‍රියාත්මක කරන ලද ස්ථානය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ඇස්තමේන්තුගත වියදම |
|---|---|---|---|
| කළුතර | පස්දුන් රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 320 | 2,400,000.00 |
| ගම්පහ | වේයන්ගොඩ සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 320 | |

(සටහන 12)

## 2.2.7.2. අන්‍ය භාෂා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

- හැඳින්වීම

බුදු දහමේ දිගු කාලීන චිරස්ථිතිය සහ පැවැත්ම සඳහා වර්තමාන සමාජය තුළ විවිධ භාෂාවන් පිළිබඳ භික්ෂූන් වහන්සේලා සතු දැනුම, අවබෝධය හා ප්‍රායෝගික භාවිතය ඉතා වැදගත් වේ. ඒ වෙනුවෙන් මෙරට වාසය කරන බෞද්ධ, හින්දු මෙන් ම ලොව බුදු දහම පවතින රටවල්වල ජනතාව වෙනුවෙන් ධර්ම ඥානය පැතිරවීම සඳහා දෙමළ, ඉංග්‍රීසි, පාලි, සංස්කෘතික භාෂා ඉගැන්වීමටත් භික්ෂූන් වහන්සේලා සතු භාෂා ඥානය පුළුල් කිරීම සඳහාත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

- අරමුණු

භික්ෂූන් වහන්සේලාට ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා භාෂා හැකියාවන් වර්ධනය කිරීම හා විධිමත් භාෂා ඥානයක් ලබා දීම.

- ක්‍රියාත්මක ක්‍රමවේදය

2018 වර්ෂයේ අනුරාධපුර භික්ෂු විශ්ව විද්‍යාලය, කැළණිය විශ්ව විද්‍යාලය හා කොළඹ විශ්ව විද්‍යාලයන්හී භාෂා අධ්‍යයන අංශවල සහය ලබාගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මෙහි දී විවිධ භාෂා සඳහා සහතික පත්‍ර, ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා යන අදියරයන් ඔස්සේ ඒ ඒ අධ්‍යාපන ආයතන මගින් භාෂා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇති අතර දේශීය හා විදේශීය වශයෙන් ථෙරවාදී බුදු දහම ප්‍රචාරය කිරීම සඳහා භාෂා ප්‍රවීණතාවයක් සහිත භික්ෂූන් වහන්සේලා සංචිතයක් පිහිටුවීමටත් අවශ්‍ය තැන්හී දී එම භික්ෂූන් වහන්සේලාගේ සේවය ලබා ගැනීමටත් අපේක්ෂිත ය. 2018 වර්ෂයේ දී ද මෙම භාෂා ප්‍රවර්ධන වැඩසටහන පුළුල් කරමින් චීන, ජපන්, කොරියන්, තායිභාෂා පාඨමාලා දක්වා ප්‍රවර්ධනය කිරීමට කටයුතු කර ඇත. කැළණිය විශ්ව විද්‍යාලය හා කොළඹ විශ්ව විද්‍යාලයේ භාෂා අධ්‍යයන පීඨ මගින් පහත සඳහන් පරිදි පාඨමාලා දියත් කරනු ලැබේ.

| ආයතනය | පාඨමාලාව | ප්‍රතිලාභීන්සංඛ්‍යාව | ලබාදී ඇතිප්‍රතිපාදන (රු.) | වෙනත්කරුණු |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකාසංවර්ධනපරිපාලනආයතනය | ඉංග්‍රීසි ඩිප්ලෝමා 1 අදියර | 1 | 20,000.00 | පාඨමාලාව අවසන් කර ඇත. |
| | ඉංග්‍රීසි ඩිප්ලෝමා 2 අදියර | 1 | 25,000.00 | පාඨමාලාව අවසන් කර ඇත. |
| කොළඹවිශ්වවිද්‍යාලය | ඉංග්‍රීසිසහතිකපත්‍රපාඨමාලාව | 30 | 900,000.00 | පාඨමාලාව අවසන් කර ඇත. |
| කොළඹවිශ්වවිද්‍යාලය | චීන භාෂා සහතික පත්‍ර පාඨමාලාවේ 2 වන අදියර | 30 | 600,000.00 | පාඨමාලාව අවසන් කර ඇත. |
| ශ්‍රී ලංකාභික්ෂුවිශ්වවිද්‍යාලය | ඉංග්‍රීසි ඩිප්ලෝමාපාඨමාලාව | 38 | 684,000.00 | පාඨමාලාව අවසන් කර ඇත. |
| කැළණිය විශ්ව විද්‍යාලය | කොරියානු භාෂා සහතික පත්‍ර පාඨමාලාවේ 2 වන අදියර | | | පාඨමාලාව අවසන් කර ඇත. |
| එකතුව | | 100 | 2,229,000.00 | |

(සටහන 13)

2018.12.31දිනට මෙම වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය සටහන 1 හි 7 හිඇතුළත් වේ

## 2.2.8. නේපාලයේ ඇති වූ භූමිකම්පාවෙන් හානියට පත් ආගමික සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය

නේපාලයේ ඇති වූ දරුණු භූමිකම්පාවෙන් එරට පිහිටි ආගමික සිද්ධස්ථාන රාශියකට හානි සිදු වූ අතර ශ්‍රී ලංකාව හා නේපාලය අතර පවතින දිගුකාලීන රාජ්‍ය තාන්ත්‍රික හා ඓතිහාසික සම්බන්ධතාවය සහ භූමිකම්පාවෙන් සිදු වී ඇති අති විශාල හානිය සැළකිල්ලට ගෙන එම සිද්ධස්ථාන එකක් හෝ කිහිපයක් ශ්‍රී ලංකා රජයේ මැදිහත් වීමෙන් ප්‍රතිසංස්කරණය කර දීමට යෝජනා විය.

ඒ අනුව නේපාලයේ එලෙස හානියට පත් බෞද්ධ සිද්ධස්ථානයක් හා හින්දු කෝවිලක් ශ්‍රී ලංකා රජය විසින් ප්‍රතිසංස්කරණය කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව එරට පිහිටි බෞද්ධ විහාරස්ථාන අතුරින් හානියට පත් වූ ස්වායම්බුනාත්හි ආනන්ද කුටි බෞද්ධ විහාරස්ථානය හා ලිලිට්පූර් හී රාතෝ මච්චින්ද්‍රනාත් හින්දු කෝවිල ප්‍රතිසංස්කරණය කිරීමට තෝරාගෙන ඇත. එම තෝරා ගැනීම පිළිබඳව එරට බලධාරීන්ගේ එකඟතාවය ඇතිව 2015 ජුනි 25 වන දින පැවැති භූමිකම්පාවෙන් හානියට පත් නේපාලය යළි ගොඩනැංවීම සඳහා වූ ජාත්‍යන්තර ආධාර සමුළුවට ශ්‍රී ලංකාවේ දායකත්වය දැනුම් දී ඇත.





නේපාල ශ්‍රී ලංකා තානාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද වියදම් ඇස්තමේන්තුව අනුව ස්වායම්බුනාත්හී ආනන්දකුටි බෞද්ධ විහාරස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නේපාල රුපියල් 203,617,620.00 (ශ්‍රී ලංකා රු.මි. 277) ක් ද රාතෝ මච්චින්ද්‍රනාත් හින්දු කෝවිල ප්‍රතිසංස්කරණය සඳහා නේපාල රුපියල් 50,000,000.00 (ශ්‍රී ලංකා රු.මි. 68) ක් ද වැය කිරීමට ආරම්භයේදී සැලසුම් කර තිබුණි.

2017.12.31 වන විට මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රු.මි. 245 ක් වෙන්කර තිබුණු අතර එදිනට සමුච්ඡිත පිරිවැය රු.මි. 179.50 කි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය විමසා බලන 12 වන මෙහෙයුම් කමිටු රැස්වීමේදී ව්‍යාපෘතියේ වැඩ නිම කිරීම සඳහා තවදුරටත් දැරීමට සිදුවන අතිරේක පිරිවැය රු.මි. 105.00 ක් ලබා ගැනීම සඳහා 2018.04.11 ඉදිරිපත් කළ අමාත්‍යමණ්ඩල සංදේශය සඳහා දින අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව මුළු ව්‍යාපෘති පිරිවැය ඇස්තමේන්තුව රු.මි. 450 ක් වශයෙන් සංශෝධනය විය.

2018.12.31දිනට මෙම ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය සටහන 16 හි පෙන්වා ඇත.

2018.12.31දිනට ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත සටහනින් දැක්වේ

| ව්‍යාපෘතියේ නම | සංවර්ධනකාර්යය | භෞතිකප්‍ර ගතිය | **2018.12.31** දිනට සමුච්චිත ප්‍රතිපාදන රු. | **2018.12.31** දිනට සමුච්චිත වියදම (රු.) |
|---|---|---|---|---|
| ආනන්දකුටි විහාරය | සංඝාවාස1 කොටස | 90% | 450,000,000.00 | 293,541,064.36 |
| | සංඝාවාස 2කොටස | | | |
| | ධර්මශාලාව | | | |
| | සීමා ශාලාව | | | |
| | ස්ථූපය | | | |
| | ධාතු මන්දිරය | | | |
| | සීමා ශාලාව හා ස්ථූපයඅතර ආරක්ෂිත බැම්ම | | | |
| | අමතර සංවර්ධන කාර්යයන් | | | |
| රාතෝම්මච්චින්ද්‍රනාත්හින්දු කෝවිල | | | | |
| එකතුව | | | **450,000,000.00** | **293,541,064.36** |

(සටහන 14)

## 2.2.9. පාරම්පරික උඩරට නර්තනය සහ සංස්කෘතික උරුමයන් සුරැකීමට ශ්‍රී දළදා මාළිගාවට අනුයුක්ත ව පල්ලේකැලේ ප්‍රාසාංගික පුහුණු ආයතනයක් ආරම්භ කිරීම

දේශීය පාරම්පරික කලා සම්ප්‍රදායන් අනාගත පරපුර වෙත දායාද කිරීමේ අභියෝගය ජය ගැනීමේ අරමුණින් ඉන්දියානු රජයේ මූල්‍ය ප්‍රදානයන් මත ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මි. 145 කි. මෙම ව්‍යාපෘතියට අදාළ අවබෝධතා ගිවිසුමේ කොන්දේසිවලට අනුව ව්‍යාපෘතියේ වැඩ වටිනාකම මත අගය කෙරුණු වැට් මුදල් ගෙවීම සඳහා දේශීය අරමුදල් (17) මඟින් රු.මි. 5 ක් ද ව්‍යාපෘතියේ නිම් වැඩ වෙනුවෙන් රු.මි. 89 ක ප්‍රතිපාදන ද 2018 වර්ෂය සඳහා වෙන්කර ඇත.

ව්‍යාපෘතියට අදාළ ප්‍රතිපාදන කාර්යයන් ඉන්දියන් මහ කොමසාරිස් කාර්යාලය මඟින් සිදුකරන ලද අතර, ව්‍යාපෘතියේ මෙම කටයුතු අධීක්ෂණය වෙනුවෙන් බුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය, ඉන්දියන් මහ කොමසාරිස් කාර්යාලය හා දළදා මාළිගාවේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් මෙහෙයුම් කමිටුවක් පත් කර ඇත.





.

| ව්‍යාපෘති නාමය | ව්‍යාපෘති කාලය | මූල්‍ය ප්‍රභවය | 2018 ප්‍රතිපාදන රු.මි. | සහතික කළ වියදම රු.මි. | | ව්‍යාපෘති ක්‍රියාකරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | | ව්‍යාපෘතිය | වැට් | | |
| ශ්‍රී දළදා මාළිගාවට අනුබද්ධ සංස්කෘතික උරුමයන් පිළිබඳ පුහුණු මධ්‍යස්ථානය ඉදි කිරීම. | 2016 - 2019 | ඉන්දියන්රජය | 89.0 | 43.28 | | ප්‍රසම්පාදන කාර්යයන් ක්‍රියාත්මක කිරීම,ගිවිසුම්ගත වීම, කොන්ත්‍රාත් ප්‍රදානය | 100% |
| | | ශ්‍රීලංකා රජය | 5.0 | | 1.3 | පන්ති කාමර ගොඩනැඟිලි ඉදි කිරීම | 75% |
| | | | | | | බහුකාර්ය ගොඩනැඟිල්ල ඉදි කිරීම | 50% |
| **මුළු එකතුව** | | | | 43.28 | 1.3 | | |

(සටහන 15)

# 3. විශේෂ ව්‍යාපෘති

## ❧ ශාක්‍ය ජනපදය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය

2017.03.30 වන දිනබුද්ධශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යාංශය හා ලයිට් ඔෆ් ඒෂ්‍රියා පදනම එක් ව අත්සන් කළ අවබෝධතා ගිවිසුමක් මත ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 500 ක ආයෝජනයක් කිරීමටත්, එය ගිවිසුම් අත්සන් කළ දින සිට වසර 03 ක් තුළ නිම කිරීමටත් ලයිට් ඔෆ් ඒෂියා පදනම එකඟව ඇත. එහි කටයුතු විධිමත් ව කළමනාකරණය හා අධීක්ෂණය කිරීම සඳහා ශාක්‍ය රාජධානි භාරය පිහිටුවා ඇති අතර, භාරයෙහි භාරකරුවන් විසින් මෙම ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සෑම මාස දෙකකට වරක් රැස්වෙන භාර රැස්වීමේ දී සමාලෝචනයට ලක් කෙරේ. 2018.12.31 දින වන විට ශාක්‍ය රාජධානි භාරයේ රැස්වීම් වාර 06 ක් පවත්වා ඇති අතර, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මෙහි පහත සඳහන් සංවර්ධන සැළැස්ම අනුව පෙළගස්වා ඇත.






| ප්‍රධාන ඉදිකිරීම් ක්‍රියාකාරකම් | භාවිතයට ගැනීමටයෝජිත භූමිය අක්කර | ඇස්තමේන්තු පිරිවැය රු.මි. | **2018.12.31**දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| මූලික වැඩබිම් සැකසීම, කාර්යාලය ස්ථාපිත කිරීම. | - | 10.0 | 100% |
| සීමා වැට සැකසීම | - | 5.0 | බුද්ධශාසන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන වෙන් කළ යුතු ය. |
| ශාක්‍ය රාජධානිය (ප්‍රධාන මාළිගා රම්‍ය, සුරම්‍ය, සුභ) | 12 | 334.0 | වැඩආරම්භ කර ඇත. |
| ලුම්බිණි උද්‍යානය | 8 | 25.0 | |
| පැල උද්‍යානය හා තවාන | 1 | 5.0 | |
| යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | 15 | 100.0 | |
| බෞද්ධ නාළිකා සංකීර්ණය | 4 | 250.0 | |
| කලා මධ්‍යස්ථානය | 3 | 350.0 | මූලිකසැළසුම් සකස් කර ඇත. |
| වාණිජ හා කළමනාකරණ මධ්‍යස්ථානය | 2 | 150.0 | |
| ආරක්ෂිත මුරකුටි අංගනය | 1 | 10.0 | |
| තාක්ෂණික මධ්‍යස්ථානය | 1 | 50.0 | |
| පරිසර මධ්‍යස්ථානය | 2 | 25.0 | |
| ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය | 2 | 150.0 | |
| භාවනා මධ්‍යස්ථානය | 6 | 250.0 | |
| නේවාසික මධ්‍යස්ථානය | 6 | 900.0 | |
| විශ්ව ගම්මානය | 12 | 2500.0 | |
| **මුළු එකතුව** | **75** | **5114.0** | |

(සටහන 16)

# 4. වෙනත් සංවර්ධන කාර්යයන්

## ❧ නවදිල්ලි නුවර ශ්‍රී ලංකා බෞද්ධ වන්දනා විශ්‍රාම ශාලාව

**➢ ආරම්භය**

ඉන්දීය හිටපු අග්‍රාමාත්‍ය ජවහර්ලාල් නේරු මැතිතුමාගේ පාලන කාලයේ දී (1958) ලාංකීය බෞද්ධ වන්දනා කරුවන්ගේ සුභසාධනය සඳහාප්‍රධානදූම්රියස්ථානයටයාබඳවවර්ෂයකට රුපියලක බදු ක්‍රමය යටතේ ඉඩමක් වෙන් කරන ලදී.

**➢ වර්තමාන තත්ත්වය**

2001 වර්ෂයේදී මෙම විශ්‍රාම ශාලාව අළුත්වැඩියා කිරීමෙන් පසු විශ්‍රාම ශාලාව පවත්වාගෙන යාමේ වගකීම බුද්ධශාසන අමාත්‍යාංශය වෙත පවරා ඇත. දැනට නවදිල්ලියේ ශ්‍රී ලංකා මහකොමසාරිස්ගේ පාලනය යටතේ පවතින මෙම විශ්‍රාමශාලාවේ කළමනාකරණය හා පාලනය විධිමත් කිරීම සඳහා කරන ලද යෝජනා ඇතුළත්ව බුද්ධශාසන අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයටද අනුමැතිය ලැබී ඇත. ඒ අනුව පුණ්‍යාභාරයක් පිහිටුවීමට සකස් කළ භාර ඔප්පුව සඳහා නීතිපතිතුමාගේ නිර්දේශයන් ලැබී ඇති අතර, භාර ඔප්පුවට අදාළ සංශෝධන සිදුකර භාර ආඥා පනතේ 114 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

## ❧ නේපාලයේ ලුම්බිණි නුවර පිහිටි ශ්‍රී ලංකා මහා විහාරයේ සංවර්ධන කටයුතු

නේපාලයේ ලුම්බිණි නුවර පිහිටි ශ්‍රී ලංකා මහා විහාරය ශ්‍රී ලංකා රජයට අයත් ඓතිහාසික පූජා භූමියක් වන අතර 2015 නේපාලයේ ඇති වූ භූමිකම්පාවෙන් පසු නිසි ආකාරයෙන් නඩත්තුවක් සිදු නොවී පැවති අතර, නේපාල තානාපතිතුමිය විසින් කරන ලද ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් එහි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලදී. ඒ අනුව මෙම වහලවල්වල ප්‍රතිසංස්කරණ කටයුතු ශ්‍රී ලංකා තානාපතිතුමියගේ ක්‍රියාත්මක බලධාරීත්වය යටතේ මෙම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත ව අළුත්වැඩියා කටයුතු සිදු කර ඇත.

2016 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහා විහාරයේ ඉහත වහලවල් අළුත්වැඩියා කිරීමේ කටයුතු නේපාල් ඔප්ෂනල් සමාගම මඟින් ගිවිසුමකට යටත්ව ඉටුකරගෙන ඇති නමුදු එහි ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය තහවුරු කරගැනීමට තාක්ෂණික නිළධාරී වාර්තාවන් ලබාගැනීමට සිදු වූ ප්‍රමාදය හා අනෙකුත් භෞතික කාරණා සහ මෙම විහාරයේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන ලබාදිය හැකි නිශ්චිත වැය ශීර්ෂයක් නොවූ බැවින් ඒ සඳහා ප්‍රතිපාදන ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2018.07.24 දින යොමු කරනු ලදුව ඒ සඳහා ප්‍රතිපාදන අනුමත කර ඇත. මේ සඳහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන ලබාගැනීමෙන් අනතුරුව නිම කළ වැඩ සඳහා ගෙවීම් කිරීමටත් ඉතිරි සංවර්ධන කාර්යයන් සඳහා ගිවිසුම්ගත වීමටත් නියමිතය.

## ඝ නේපාල දුටුගැමුණු විශ්‍රාම ශාලාව






ලුම්බිණි පූජා භූමිය වන්දනා කිරීමට යන ශ්‍රී ලාංකික වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිකළ “දුටුගැමුණු විශ්‍රාම ශාලාව”ලුම්බිණි සංවර්ධන භාරය මඟින් ලුම්බිණි සංවර්ධන සැළැස්මෙන් ලබාදුන් ඉඩමක ඉදිකර ඇත.මෙහි පාලනය හා කළමනාකරණය විටින් විට විවිධ පාර්ශව වෙත සංක්‍රමණය වීමෙන් පසු සිදු ව තිබුණු අසාර්ථකත්වය දුරලමින් 2012 වර්ෂයේ දී එහි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා බුද්ධශාසන අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයක් මත ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ඇත. මෙම ප්‍රතිසංස්කරණවලින් පසු 2015.08.01 දින වන්දනාකරුවන් සඳහා නැවත විවෘත කරන ලදී. ඉන්පසු මෙය බුද්ධශාසන අමාත්‍යාංශයෙන් පත් කළ කළමනාකරුවෙකු යටතේ ක්‍රියාත්මක වන අතර, 2017 වර්ෂයේ එහි කටයුතු සඳහා සහාය කළමනාකරුවෙකු ද පත් කර යවා ඇත.

වන්දනාවේ යෙදෙන ශ්‍රී ලාංකික මෙන් ම විදේශීය වන්දනාකරුවන්ට අවශ්‍ය නේවාසික පහසුකම් සැපයීමටත්, උත්සව හා සාද අවස්ථා සඳහා පහසුකම් සැපයීමටත් අවශ්‍ය පහසුකම් මෙම විශ්‍රාම ශාලාව තුළ පවතී.

නේපාලයේ දුටුගැමුණු විශ්‍රාම ශාලාවේ පරිපාලන හා මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීම සඳහා කළමනාකරුට අමතර ව සහය කළමනාකරුවෙකු 2017 වර්ෂයේ සැප්තැම්බර් මස සිට පත්කර යවා ඇත.

නේපාලයේ ලුම්බිණි විශ්‍රාම ශාලාවේ 2018.01.01 සිට 2018.12.31 දින දක්වා ආදායම් හා වියදම් තත්ත්වයන් සහ නේවාසික කාමර වෙන් කිරීම් තත්ත්වය පහත දැක්වේ.

| මාසය | ආදායම ( ශ්‍රී .ලංකා රු) | *වියදම (ශ්‍රී .ලංකා රු) |
|---|---|---|
| ජනවාරි | 410,878.00 | 299,110.50 |
| පෙබරවාරි | 672,776.00 | 446,449.90 |
| මාර්තු | 700,382.80 | 361,595.00 |
| අප්‍රේල් | 188,162.00 | 321,993.10 |
| මැයි | 52,585.00 | 339,146.60 |
| ජූනි | 71,900.00 | 335,453.30 |
| ජූලි | 612,040.00 | 519,045.80 |
| අගෝස්තු | 968,220.00 | 572,352.51 |
| සැප්තැම්බර් | 1,039,276.00 | 476,761.00 |
| ඔක්තෝම්බර් | 977,553.64 | 401,312.60 |
| නොවැම්බර් | 1,578,893.34 | 472,500.60 |
| දෙසැම්බර් | ලැබී නැත. | 472,500.60 |
| **එකතුව** | **6,661,238.82** | **5,018,221.51** |

(සටහන 17)

*වියදම් යන්නෙහි වැටුප් ගෙවීම්, විදුලි බිල් පත්, දුරකථන බිල් පත්, ජල බිල් පත් හා නඩත්තු කටයුතු වෙනුවෙන් දරන ලද දෑ ඇතුළත් ය.

නේපාලයේ දුටුගැමුණු විශ්‍රාම ශාලාවේ ජලය ලබා ගැනීමට නළ ළිඳ ස්ථාපනය සඳහා රු.මි. 2.35 ක් පූජා භූමි සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත. මෙමඟින් නේවාසික වන්දනාකරුවන්ට අවශ්‍ය පානීය ජල පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට අපේක්ෂිත ය.

## ඍ අනුරාධපුර කුරුන්දන් කුලම රජරට චාරිකා නිවාසය

අනුරාධපුර කුරුන්දන් කුලම රජරට චාරිකා නිවාසය බුද්ධශාසන අමාත්‍යාංශයේ පාලනය යටතේ පවතින රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සහ එසේ නොවන අය වෙනුවෙන් අනුරාධපුර නගරය සංචාරය කිරීමේ දී නවාතැන් පහසුකම් සළසා ගත හැකි නිවාඩු නිකේතනයකි. අනුරාධපුර මිහින්තල පාරේ පිහිටි මෙම නිවාඩු නිකේතනය තුළ එකවර 30 දෙනෙකුට පමණ නේවාසික පහසුකම් සළසා දීමට හැකි කාමර, ජලය, සනීපාරක්ෂක පහසුකම්වලින් සමන්විතය. 2018 වර්ෂයේ කුරුන්දන්කුලමරජරටචාරිකා නිවාඩු නිකේතනයෙහි නවාතැන් පහසුකම් සැළසීම සහ ආදායම් වියදම් තත්ත්වය පහත සටහනින් දැක්වේ.

**අනුරාධපුර කුරුන්දන්කුලම රජරට චාරිකා නිවාසයේ 2018-01-01 සිට 2018.12.31**

**වන දින දක්වා ආදායම හා වියදම හා නවාතැන් පහසුකම් ලබා දීමේ තත්ත්වය**

| **2018.12.31දිනට ආදායම් වියදම් තත්ත්වය** | | | |
|---|---|---|---|
| මාසය | ආදායම (රු.) | වියදම (රු.) | වෙනත් වියදම (රු.) |
| ජනවාරි | 35,500.00 | 17,655.42 | 20,339.99 |
| පෙබරවාරි | 51,500.00 | 12,156.62 | |
| මාර්තු | 45,700.00 | 14,946.22 | |
| අප්‍රේල් | 40,200.00 | 29,372.11 | |
| මැයි | 47,800.00 | 24,176.35 | |
| ජූනි | 45,100.00 | 13,058.96 | 61,749.73 |
| ජූලි | 56,500.00 | 15,410.52 | 10,650.00 |
| අගෝස්තු | 148,600.00 | 25,698.50 | |
| සැප්තැම්බර් | 51,000.00 | 28,135.73 | 30,157.57 |
| ඔක්තෝම්බර් | 32,000.00 | 11,945.40 | 8496.18 |
| නොවැම්බර් | 26,500.00 | 10,317.46 | |
| දෙසැම්බර් | 57,800.00 | 16,854.78 | |
| **මුළු එකතුව** | **638,200.00** | **219,728.07** | **131,393.47** |

(සටහන18)

* වියදම් වශයෙන් දක්වා ඇත්තේ ජල බිල්පත්, විදුලි බිල්පත්, දුරකථන බිල්පත් පියවීමයි.
* වෙනත් වියදම් වශයෙන් දක්වාඇත්තේ නඩත්තු සහ කුඩා ප්‍රමාණයේ භාණ්ඩ මිළදීගැනීම් ආදියයි

## 5. විවිධ විශේෂ උත්සව කටයුතු

### ❧ රාජ්‍ය වෙසක් උත්සවය

ශ්‍රී සම්බුද්ධත්වයෙන් වර්ෂ 2562 ක් ගතවන 2018 වර්ෂයේ දී බුදු තෙමඟුල සිහි කරනු වස් රාජ්‍ය අනුග්‍රහයෙන් පවත්වන ලද රාජ්‍ය වෙසක් උත්සවය මෙවරත් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කුරුණෑගල බිංගිරිය දේවගිරි රජමහා විහාරස්ථානය කේන්ද්‍ර කොට ගෙන සිදු කරන ලදී.





රාජ්‍ය වෙසක් උත්සවයේ අති විශේෂ කාර්යභාරයන් රැසක් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද අතර, රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමී ව 2018 අප්‍රේල් මස 26 වන දින සිට සතියක කාලයක් "වෙසක් සතිය" ලෙස නම් කොට පාසල්, දහම් පාසල්, රාජ්‍ය ආයතන හා බෞද්ධ සංවිධානවල සහභාගීත්වයෙන් දිවයින පුරා සීල සමාදාන වැඩසටහන් ඇතුළු ශාසනික ප්‍රබෝධය ඇති කරන සහ බෞද්ධ පුනරුදයට ඉවහල් වන ආගමික වැඩසටහන් හා සමාජ සත්කාරක වැඩසටහන් රාශියක් සැළසුම් කොට ක්‍රියාත්මක කරන ලදී. මෙම උත්සවයේ තෝරාගත් අංග සහ වැඩසටහන් සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල අනුග්‍රාහකත්වය හා දායකත්වය ලබා ගැනීමට ද කටයුතු කරන ලදී.

මේ සඳහා බුද්ධශාසන අමාත්‍යාංශයේ විහාරස්ථාන සංවර්ධනය යටතේ හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ දහම් පාසල් 158 ක් සඳහා රු.මි. 25 ක් ද විහාරස්ථාන 235 ක් වෙනුවෙන් රු.මි. 65.18 ක් ප්‍රතිපාදන ලබා දෙමින් විහාරස්ථානවල භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගන්නා ලදී. තවද පූජා භූමි වැය ශීර්ෂය යටතේ රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වුණු බිංගිරිය දේවගිරි රජමහා විහාරස්ථානයේ භෞතික යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රු.මි. 46 ක වියදමක් දරන ලදී.

### ❧ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 154 වන ජන්ම සංවත්සර මහෝත්සවය

බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා මෙන්ම ශ්‍රී ලාංකීය ජන සමාජයේ උන්නතිය උදෙසා අති මහත් මෙහෙවරක් ඉටුකළ අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන්ගේ 154 වන ජන්ම සංවත්සර මහෝත්සවය 2018 සැප්තැම්බර් 17 වන දින ප.ව. 3.00 ට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි.

මේ සඳහා ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන් වහන්සේලා ප්‍රමුඛ මහා සංඝරත්නය, මැති ඇමතිවරුන්, ත්‍රිවිධ හමුදාපතිවරුන් ඇතුළු හමුදා නිළධාරීන්, රාජ්‍ය නිළධාරීන්, විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ සිසු සිසුවියන් ඇතුළු 1200 කට අධික පිරිසක් සහභාගී විය.

ධර්මපාල චරිතයෙන් සමාජයට ගත හැකි ආදර්ශ ඇතුළත් පොත් පිංචක් ද සකස් කර පැමිණ සිටි පිරිස වෙත ලබාදුන් අතර, ඊට අමතර ව මේ හා සමගාමී ව ධර්මපාල චරිතය හා චින්තනය විදහා දැක්වෙන කෙටි චිත්‍රපටයක් ඇතුළත් සංයුක්ත තැටි ලංකාවේ සියළුම විහාරස්ථාන වෙත බෙදා හැරීමට ද කටයුතු කරන ලදී.

පැමිණ සිටි පිරිස වෙනුවෙන් පූජ්‍ය බානගල උපතිස්ස නායක ස්වාමීන් වහන්සේ සහ පූජ්‍ය ඕමල්පේ





සෝභිත නායක ස්වාමීන් වහන්සේ උපදේශාත්මක දේශනා පවත්වන ල අතර මෙම උත්සවය මුද්‍රා නාට්‍යය, ගායනා,වැඩසටහන් ආදී විවිධ සංස්කෘතිකාංගයන්ගෙන් විචිත්‍රවත් ව පැවැත්විණි.

තවද ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ 154 වන ජන්ම සංවත්සර මහෝත්සවය හා සමගාමී ව බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කරන ලද සමස්ත ලංකා දහම් පාසල් කථික, පද්‍ය ගායනා, ගද්‍ය රචනා සහ විවෘත පද්‍ය නිර්මාණ තරඟවල ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග සහ සහතික පත්‍ර ගරු බුද්ධශාසන අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමන් අතින් ප්‍රධානය කෙරිණි.

ශාසනික හා ජාතික වශයෙන් අතිශය වැදගත් මෙහෙවරක් ඉටුකළ අනගාරික ධර්මපාලතුමාගේ ගුණානුස්මරණ උත්සවය ජනාධිපති කාර්යාලය හා බුද්ධශාසන අමාත්‍යාංශය එක් ව මෙම වසරේ ද සාර්ථක ව පවත්වන ලදී.

# 6. සංවර්ධන සේවා සැපයීම්

## ❖ විහාරස්ථාන කාර්ය දර්ශන මුද්‍රණය කිරීම හා බෙදා හැරීම

දිවයින පුරා විසිරී පවතින විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලාගේ භාවිතය සඳහා මෙම දිනපොත් මුද්‍රණය කරනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නිකායත්‍රයේ තොරතුරු සහ ත්‍රෛනිකායට අනුබද්ධ සෙසු නිකාය හා පාර්ශවයන් ගී තොරතුරු, සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තොරතුරු ආදී ස්වාමීන් වහන්සේලාට වැදගත් වන තොරතුරු ඒකරාශී කර බෞද්ධ විහාරස්ථානවල පරිහරණයට සුදුසු පරිදි මෙම කාර්ය දර්ශනයසැකසී ඇත. 2018 වර්ෂය සඳහා මෙම විහාරස්ථාන කාර්ය දර්ශන පොත් 14,700 ක් මුද්‍රණය කර බෙදාහරින ලදඅතර ඒ සඳහා වියදම රුපියල් මිලියන 3.66 කි.
2019 වර්ෂය සඳහා ද මෙම විහාරස්ථාන කාර්ය දර්ශනයේ පිටපත් 15,000 ක් මුද්‍රණය කොට බෙදාහැරීමට කටයුතු සැළසුම් කර ඇත.

## 7. තොරතුරු තාක්ෂණ හා සංවර්ධන අංශය

### තොරතුරු අංශය විසින් 2018 වර්ෂයේ ඉටුකරනු ලැබූ සේවාවන්

**1. අභ්‍යන්තර පරිගණක ජාලය අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම.**

බුද්ධශාසන අමාත්‍යාංශයේ අභ්‍යන්තර ජාල පද්ධතිය නවීකරණය කිරීමට කටයුතු කිරීම සහ LGN වැඩසටහන යටතේ අමාත්‍යාංශයේ මහල් 3 ක් සඳහා wifi පහසුකම් සම්බන්ධතාවයලබා ගැනීම සඳහා කටයුතු කරන ලදී.

**2. බෞද්ධතොරතුරු පද්ධතිය සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම.**

බුද්ධශාසන අමාත්‍යාංශය හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව එක්ව මාර්ගගත තොරතුරු පද්ධතියක් නිර්මාණය කර මේ වන විට සියළුම බෞද්ධ විහාරස්ථාන පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඇති අතර, දිස්ත්‍රික් මට්ටමින් සමායෝජක නිළධාරීන් පුහුණු කරමින් තොරතුරු පද්ධතිය සඳහා තොරතුරු ඇතුළත් කිරීම සහ යාවත්කාලීන කිරීම පිළිබඳ ව පුහුණුවක් ලබා දෙනු ලැබේ. මේ වන විට කුරුණෑගල සහ රත්නපුර දිස්ත්‍රික්කයන්හි සමායෝජක නිළධාරීන් පුහුණු කර අවසන් වී ඇති අතර අනෙකුත් දිස්ත්‍රික්කයන්හි මෙම පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැළසුම් කර ඇත.

**3. අමාත්‍යාංශ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම.**

අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය මේ වනවිට අන්තර්ජාලයේ ක්‍රියාත්මක වන අතර, දිනපතා එහි අවශ්‍ය යාවත්කාලීන කිරීම් සිදු කරනු ලැබේ.

**4. රාජ්‍ය වෙසක් උත්සවය නිමිත්තෙන් DVD පට බෙදාහැරීම.**

රාජ්‍ය වෙසක් උත්සවය නිමිත්තෙන් සාරධර්ම ප්‍රවර්ධනය කිරීම සඳහා සාරධර්ම ඇතුළත් කෙටි චිත්‍රපටි සහිත DVD පට සියළුම විහාරස්ථාන වෙත බෙදාහැරීමට කටයුතු කරන ලදී . එම විහාරස්ථාන විසින් වෙසක් පොහෝ දින විහාරස්ථානවල ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලද අතර, මේ මඟින් සාරධර්ම ප්‍රවර්ධනය සඳහා අමාත්‍යාංශයේ මැදිහත් වීම ලබා දෙන ලදී.

**5. අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණික කටයුතු වර්ධනය සඳහා සහයදීම.**

අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණික උපකරණ, දෘඩාංග, මෘදුකාංග වැනි උපකරණ, සේවාවන් මිලදි ගැනීම් සඳහා පිරිවිතර සකස් කර දීම සහ එම භාණ්ඩ මිලදී ගැනීම සඳහා තාක්ෂණික සහය ලබාදීම සිදු කරන ලදී.

## 6. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ ජන්මදින සැමරුම වෙනුවෙන් DVD පට බෙදා හැරීම.

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ ජන්මදින සැමරුම වෙනුවෙන් එතුමාගේ චරිතාපදානය ඇතුළත් DVD පට 12000 ක් දිවයිනේ සියළුම දහම්පාසල් වෙත බෙදාහරින ලදී. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාගේ චරිතාපදානය දහම් පාසල් සිසුන්ගේ දැනුවත් කිරීම සඳහා සියළුම දහම් පාසල්වල ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරනලදී.

## 7. ජනපතිට කියන්න වැඩසටහන 2018 ප්‍රගතිය.

| "ජනපතිට කියන්න" වැඩසටහන -2018 වර්ෂය | | |
|---|---|---|
| මුළු පැමිණිලි සංඛ්‍යාව | ක්‍රියාමාර්ග ගනිමින් පවතින පැමිණිලි සංඛ්‍යාව | වැඩ කටයුතු අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාව |
| 205 | 164 | 41 |

(සටහන 19)

## 8. බෞද්ධ උපදේශක සභාව පැවැත්වීම - 2018 වර්ෂය

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිසත් ආගමික හා ශාසනික වශයෙන් ඇතිවන්නා වූ ගැටළු නිරාකරණය පිණිසත් බුද්ධශාසන අමාත්‍යාංශයට අවශ්‍ය උපදෙස් හා අනුශාසනා ලබාදීම සඳහා ත්‍රෛනිකායික අතිපූජ්‍ය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ අනුශාසනා පරිදි බෞද්ධ උපදේශක සභාවක් පිහිටුවා ඇත. සම්බුද්ධ ශාසනයේ සුරක්ෂිතතාවය උන්නතිය සඳහා බුද්ධශාසන අමාත්‍යාංශය මඟින් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග සැළසුම් කිරීමෙහිලා අවශ්‍ය අවස්ථාවල දී බෞද්ධ උපදේශක සභාව කැඳවීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව 2018 වර්ෂය තුළ මහා නායක, අනු නායක, නායක සහා ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා 33 නමකගේ සහභාගීත්වයෙන් එවැනි සාකච්ඡා වාර 06 ක් වරින් වර පවත්වා ඇත.

එහි දී භික්ෂු කතිකාවත් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත, බෞද්ධ විහාර දේවාලගම් සංශෝධන පනත, බෞද්ධ ප්‍රකාශන පළ කිරීම නියාමනය කිරීමේ පනත් කෙටුම්පත, ස්වාමීන් වහන්සේලා සම්බන්ධයෙන් රක්ෂණ ක්‍රමයන් ඇති කිරීම, බෞද්ධ බැංකුවක් ආරම්භ කිරීම, තිරසර පුණ්‍යග්‍රාම වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා බුද්ධ ධර්මය සහ ත්‍රිපිටකය විකෘති කිරීම වැළැක්වීම සඳහා වැඩපිළිවෙළක් සැකසීම ආදී වැදගත් කරුණු රැසක් පිළිබඳ ව සාකච්ඡා කර ඇති අතර, ඒවා සම්බන්ධයෙන් ගත් වැදගත් තීන්දු තීරණ කිහිපයක් ක්‍රියාත්මක කරමින් පවතී.

## 9. මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම

බුද්ධශාසන අමාත්‍යාංශයේ මාසික ප්‍රගති සමාලෝචක රැස්වීම් 2018 වර්ෂයේ දී අඛණ්ඩ ව මේ දක්වා මාසික ව පැවැත්වීමට කටයුතු කරන ලදී.ඒ අනුව අමාත්‍යාංශයේත් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේත් මූල්‍ය හා පුනරාවර්තන වැය විෂයන් පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය විමසා බලන ලද අතර අවශ්‍ය තැන්හි දී කටයුතු කඩිනම් කිරීම සඳහා තීන්දු තීරණ ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී. මෙම ප්‍රගති සමාලෝචන රැස්වීම ගරු අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බුද්ධශාසන අමාත්‍යාංශයේ හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් 2018.12.31 දින වන විට රැස්වීම් වාර 11 ක් පවත්වා ඇත.

## 10. තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ පාර්ලිමේන්තු අධීක්ෂණ කමිටු රැස්වීමට සහභාගී වීම

2018 වර්ෂයේ ගෙවී ගිය කාල පරිච්ඡේදය තුළ තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ පාර්ලිමේන්තු අධීක්ෂණ කමිටු රැස්වීම් 01 ක් සඳහා අමාත්‍යාංශයේ සහභාගීත්වය සිදුවිය.මෙම කමිටු රැස්වීම කමිටුවේ සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සී.බී. රත්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු සංකීර්ණයේ දී පැවැත්වුණු අතර, අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන සංවර්ධන වැඩසටහන් දීප ව්‍යාප්ත ලෙස ක්‍රියාත්මක කිරීමේ දී ඒ ඒ දිස්ත්‍රික්ක නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලාට ඇතිවන ගැටලු පිළිබඳ සංවාදාත්මක සාකච්ඡාවකට එළඹීමට, විමසීම් කිරීමට අවස්ථාව ලැබේ.

මෙහි දී අමාත්‍යාංශයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කරන ලද ක්‍රියා පිළිවෙත පිළිබඳ පූර්ව වර්ෂ හා සංසන්දනය කර බලන විට උපනතියක් දැකිය හැකි බවට අදහස් පළ විය. මෙම අදහස අමාත්‍යාංශයේ ඉදිරි මෙහෙවර කාර්යක්ෂම ව කිරීමට මහත් පිටිවහලකි.

මේ සඳහා බුද්ධශාසන අමාත්‍යාංශයේ සහ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිළධාරීන් සහභාගී විය.

## 11. මූල්‍ය කළමනාකරණය සඳහා යොදා ඇති පාලන ක්‍රමවේදය

| ශීර්ෂය | පුනරාවර්තන වියදම | | | ප්‍රාග්ධන වියදම | | |
|---|---|---|---|---|---|---|
| | 2018 ඇස්තමේන්තුව (රු.මි.) | 2018.12.31 දිනට වියදම (රු.මි.) | ප්‍රතිශතය % | 2018 ඇස්තමේන්තුව (රු.මි.) | 2018.12.31 දිනට වියදම (රු.මි.) | ප්‍රතිශතය % |
| බුද්ධශසන අමාත්‍යාංශය | 245.19 | 217.65 | 88% | 1078.51 | 867.79 | 80% |

(සටහන 20)

## අයවැය ඇස්තමේන්තුව අනුව 2018.12.31 වන දිනට මූල්‍ය ප්‍රගතිය

| වැය ශීර්ෂය | | 2018 ඇස්තමේන්තුව | මු.රෙ 66 මාරු කිරීම් | අතිරේක ප්‍රතිපාදන | 2018 සත්‍ය ඇස්තමේන්තුව | 2018.12.31 දිනටවියදම | 2018.12.31 දිනට ඉතිරිය | ප්‍රතිපාදන රඳවාතබා ගැනීම් | ප්‍රතිපාදනමුදා හැරීම් වලින් පසු ඉතිරිය | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | **207,360,000** | **-709,264** | **38.544,000** | **245,194,736** | **217,265,438** | **27,929,298** | **5,863,639** | **22.065.659** | **88%** |
| **101-01-01** | අමාත්‍ය කාර්යාලය | 34,110,000 | -2,382,044 | 5,900,000 | 37,627,956 | 36,961,399 | 666,557 | | 666,557 | 98% |
| **101-01-02** | අමාත්‍යාංශ පරිපාලනය හා ආයතන සේවා | 97,750,000 | 1,672,780 | 944,000 | 100,366,780 | 100,104,231 | 262,549 | | 262,549 | 99% |
| **101-01-06** | පූජා භූමිසංවර්ධනය සහ ආගමික කටයුතු නංවාලීම | 75,500,000 | | 31,700,000 | 107,200,000 | 80,199,908 | 27,001,192 | 5,863,639 | 21,136,553 | 74% |
| | මූලධන වියදම් | 696,610,000 | 709.264 | 381,193,000 | 1,078,512,264 | 867,786,547 | 210,725,717 | 109,545,539 | 101,180,178 | 80% |
| **101-01-01** | අමාත්‍ය කාර්යාලය | 2,700,000 | -365,384 | | 2,334,616 | 2,344,616 | | | | 100% |
| **101-01-01** | අමාත්‍යාංශපරිපාලනයහා ආයතන සේවා | 4,910,000 | 1,074,648 | 3,884,000 | 9,868,648 | 9,717,270 | 151,378 | | 151,378 | 98% |
| **101-01-01** | පූජා භූමිසංවර්ධනය සහ ආගමික කටයුතු නංවාලීම | 689,000,000 | | 377,309,000 | 1,066,309,000 | 855,734,661 | 21,574,339 | 109,545,539 | 101,028,800 | 80% |
| මුළු එකතුව | | 903,970,000 | | 419,737,000 | 1,323,707,000 | 1,085,051,985 | 238,655,015 | 115,409,178 | 123,245,837 | 81% |

(සටහන 21)

## 12. අභ්‍යන්තර විගණන කටයුතු සැළසුම් කිරීම

අභ්‍යන්තර විගණන අංශයෙන් ඉටු කරන ලද කාර්යයන්

**13.1. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම.**

කළමනාකරණ සහ විගණන චක්‍රලේඛ DMA/2009(I) අනුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විය යුතු වන අතර, ඒ අනුව ක්‍රියා කරමින් 2018 වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පවත්වා ඇත.

**13.2. අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කිරීම.**

අමාත්‍යාංශයේ මූල්‍ය, පාලන සහ සංවර්ධන කාර්යයන් ආවරණය වන පරිදි සකස් කරන ලද 2018 වර්ෂයේ අනුමත අභ්‍යන්තර විගණන සැළැස්ම අනුව වර්ෂය තුළ අභ්‍යන්තර විගණන වාර්තා 23 ක් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී. එම වාර්තාවල ඇතුළත් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නිළධාරීන් වෙත යොමු කර ඇත.

**13.3. අමාත්‍යාංශ ලේකම් විසින් පවරන ලද විශේෂ විමර්ශන වාර්තා ලබා දීම.**

I. 2018 රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමී ව ඓතිහාසික බිංගිරිය දේවගිරි රජමහා විහාරයේ සංවර්ධන කටයුතු පරීක්ෂාව
II. 2018 රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමී ව පැවැත් වූ නිවන් මග විමසුම පර්යේෂණාත්මක ධර්ම දේශනයේ ගෙවීම් පරීක්ෂාව

## 13. බුද්ධශාසන අරමුදල

- බුද්ධශාසන අරමුදල මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කිහිපයක්
  - සාමණේර ශිෂ්‍යාධාර (කැපකරු දායක) ක්‍රමය ක්‍රියාත්මක කිරීම. (විශේෂ)
  - සාමණේර ආයතන ලියාපදිංචි කිරීම.
  - දිවයින පුරා පිහිටි දුෂ්කර විහාරස්ථාන සඳහා කැපකරු දායක ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
  - වැඩිහිටි වියේ දී පැවිදි භාවයට පත් වූ භික්ෂූන් වහන්සේලාට පැවිදි ජීවිතයට අයත් වත්පිළිවෙත් පිළිබඳ අවබෝධයක් හා දහම් දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන.
  - සනීපාරක්ෂක පහසුකම් සඳහා ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය.
  - භික්ෂු වෛද්‍යාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
  - බෞද්ධ ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කිරීම.
    - පාලි අට්ඨකථා පොත් සිංහලයට පරිවර්තනය, මුද්‍රණය හා විකිණීම.
    - පාලි ටීකා සිංහල පරිවර්තනය.
    - පාලි අට්ඨකථා ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම.

2018.12.31 දිනට බුද්ධශාසන අරමුදල හරහා ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත පරිදි වේ.

| බුද්ධශාසන අරමුදල හරහා ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනු අංකය | ව්‍යාපෘතියේ නම | විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘතික්‍රියාකාරකම් | වාර්ෂික ඉලක්කය | වර්තමාන ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
| 1 | සාමණේරආයතන ප්‍රවර්ධන වැඩසටහන | සාමණේරභික්ෂූන් වහන්සේලාට අභිවෘද්ධිය සැලසීම. | සාමණේරස්වාමීන් වහන්සේලාගේ ආකල්ප ගොඩනැගීම සඳහා පිහිටා ඇති සාමණේර ආයතන<br>සාමණේර අධීක්ෂණ මණ්ඩලය අනුමත කිරීම.<br>මාසික මූල්‍යාධාර ගෙවීම් ශිෂ්‍ය ප්‍රමාණය අනුව ගෙවීම් කිරීම. | ආයතන 30 | ආයතන 18 | 1,142,500.00 |
| 2 | සාමණේරආයතන වර්ෂ අවසාන සමාප්ති කිරීමේ පරීක්ෂණය | සාමණේරආයතන විභාග අධීක්ෂණය | සාමණේරආයතනවල වසර දෙකක පුහුණු කාලය නිම කළ ස්වාමීන් වහන්සේලා සුදුසුකම් ලබයි.<br>ප්‍රායෝගික හා ලිඛිත පරීක්ෂණ යන අංශ දෙකකි.<br>විශේෂ දක්ෂතා දැක් වූ හිමිවරුන්ට ශිෂ්‍යත්ව ලබා දීම. | සෑම වර්ෂයක මවිභාගය පැවැත්වීම දෙසැම්බර් 25 විද්‍යාලංකාර පිරිවෙනේ දී | | 516,775.00 |
| 3 | සාමණේරකැපකරු දායක ශිෂ්‍යාධාර ක්‍රමය | සාමණේරභික්ෂූන් වහන්සේලාට අභිවෘද්ධිය සැලසීම. | සාමණේරස්වාමීන් වහන්සේලාගේ අධ්‍යාපන කටයුතු සඳහා මූල්‍යාධාර ලබාදීම.<br>විහාරස්ථානවලින් කරනු ලබන ඉල්ලීම් අනුව වසර 03 කාලය ලබාදීම.<br>මාසික රු.700 බැගින් ලබාදීම. | සාමණේරහිමිවරු 1350 | සාමණේරහිමිවරු 850 | 5,958,886.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ඉල්ලීම් පරිදි ප්‍රාදේශීය ලේකම් / ලේඛකාධිකාරී වාර්තා කැඳවීම. | | | |
| 4 | දිවයිනපුරා වැඩ සිටින භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර දීමනා ගෙවීම | වයෝවෘද්ධභික් ෂූන් වහන්සේලාට ප්‍රත්‍ය පහසුකම් සැලසීම. | රෝගය අනුව පාලක මණ්ඩලඅනුමැතියෙන් ජීවිත කාලයම හෝ වර්ෂ එකක් හෝ දෙකක් දීමනා ගෙවීම. | වාර්ෂික ඉලක්කය 50 | දීමනා ලබන හිමිවරු 44 | 2,229,000.00 |
| අනු අංකය | ව්‍යාපෘතියේ නම | විෂය ක්ෂේත්‍රය | ව්‍යාපෘති ක්‍රියාකාරකම් | වාර්ෂික ඉලක්කය | වර්තමාන ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
| 5 | වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට පැවිදි ජීවිතය සම්බන්ධ ව ප්‍රායෝගික පුහුණුවලබාදී ම | ශික්ෂාකාමීභික් ෂූන් වහන්සේ නමක් බිහි කිරීම. | දිස්ත්‍රික්ලේකම් / ප්‍රාදේශීය ලේකම් / ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා හරහා වයස 20 ඉක්මවාපැවිදි වූ භික්ෂූන් වහන්සේලාගේ තොරතුරු කැඳවීම.<br>මුළු දිවයින ම ආවරණය කරයි. | වාර්ෂික වැඩමුළු 08 | වැඩමුළු 02 | 170,499.00 |
| 6 | දිවයිනපුරා පිහිටි දුෂ්කර විහාරස්ථාන සඳහා | විහාරස්ථානවල භෞතික සංවර්ධනය කිරීම. | ඉල්ලීම්පරිදි ප්‍රාදේශීය ලේකම් / ලේඛකාධිකාරී වාර්තා කැඳවීම. | වාර්ෂිකඉ ලක්කය 50 | විහාරස්ථාන 28 | 3,000,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | සනීපාරක්ෂක පහසුකම් වෙනුවෙන් ආධාර ලබාදීම | | පාලක මණ්ඩලය අනුමැතිය පරිදි රු.100,000 බැගින්ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා මූල්‍ය ප්‍රදානය කිරීම.<br>මුළු දිවයින ම ආවරණය කරයි. | | | |
| 7 | චීනභාෂා හා සංස්කෘතික අධ්‍යයන ආයතන පිහිටුවීම | තරුණභික්ෂූන් වහන්සේලාට අභිවෘද්ධිය සැලසීම. | චීනභාෂාව ඉගෙනීමට උනන්දුව දක්වන භික්ෂූන් වහන්සේලා පිළිබඳ ව ප්‍රාදේශීය ලේකම් /ශාසනාරක්ෂක මණ්ඩල හරහා තෝරා ගැනීම.<br>මාස 06 කාලය මූලික භාෂා දැනුමලබා දීම.<br>විශේෂ දක්ෂතා දැක් වූ හිමිවරුන්ඩිප්ලෝමා පාඨමාලාව සඳහා තෝරාගැනීම. | ආයතන 03 | ආයතන 01 | 77,000.00 |
| | **එකතුව** | | | | | **8,902,998.00** |

(සටහන 22)

# වයඹ සංවර්ධනය

# 14. වයඹ සංවර්ධනය

## 2.1 වයඹ සංයුක්ත සැලැස්ම සකස් කිරීම 2017 - 2021

වයඹ පළාත ශ්‍රී ලංකාවේ ඉහළම සංවර්ධිත පළාත බවට පත් කිරීමේ අරමුණින් වයඹ සංවර්ධන අමාත්‍යාංශය විසින් පස් අවුරුදු සංයුක්ත සැලැස්ම (2017-2021) සකස් කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී වයඹ පළාතට අදාළ වන විශේෂිත ගැටළු විසඳාලීම සඳහා වයඹ පළාතේ ප්‍රමුඛ විභවතාවන් සහ අවධාරිත ක්ෂේත්‍ර පදනම් කර ගනිමින් වඩාත් යෝග්‍ය සංවර්ධන ව්‍යාපෘති ඇතුළත් 2017-2021 පස් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමත්, පස් අවුරුදු ආයතනික සැලැස්මේ සංරචකයන් වශයෙන් තුන් අවුරුදු (2018-2020) ආයෝජන සැලැස්ම සහ එක් අවුරුදු (2017) ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමත් සිදුකරන ලදී. මෙම සංයුක්ත සැලැස්ම සකස් කිරීමේ දී තාක්ෂණ සහය වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යාංශය ලබාදෙන ලදී.

### i. වයඹ සංයුක්ත සැලැස්ම යටතේ හඳුනාගත් ප්‍රමුඛ ක්ෂේත්‍ර

1. කෘෂිකර්මය හා වාරි මාර්ග
2. පශු සම්පත් හා ධීවර
3. ආයෝජන ප්‍රවර්ධන, කර්මාන්ත සංවර්ධන හා සංචාරක
4. වෘත්තීය පුහුණු හා ජීවනෝපාය සංවර්ධනය
5. ග්‍රාමීය යටිතල පහසුකම් (ග්‍රාමීය මාර්ග, ග්‍රාමීය වෙළඳ පොළ, විදුලිය, බල ශක්ති හා පානීය ජලය)

ඉහත සඳහන් පරිදි පොදුවේ එකඟ වූ ප්‍රමුඛ ක්ෂේත්‍ර පාදක කර ගනිමින් ද අමාත්‍යාංශයට පැවරී ඇති කාර්ය භාරය, වගකීම් හා සීමිත සම්පත් යන කරුණු සැලකිල්ලට ගනිමින් ද ශ්‍රී ලංකා රජයේ මැදිකාලීන හා දිගුකාලීන සමස්ථ ආර්ථික සංවර්ධන ප්‍රතිපත්තිවලට අනුගත වෙමින්ද, දළ දේශීය නිෂ්පාදනයට වයඹ පළාතෙන් ලබා දෙන දායකත්වය ඉහල තලයක් කරා ඔසවා තැබීමේ අරමුණින් 2017-2021 දක්වා කාලය සඳහා වන සංයුක්ත සැලැස්ම සකස් කරනු ලැබීය.

### 2.1.2 වයඹ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ක්ෂේත්‍ර / අංශ

- ➢ කෘෂිකර්ම හා සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පුනරුත්ථාපනය
- ➢ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය
    - ❖ ග්‍රාමීය මාර්ග සංවර්ධනය
    - ❖ විශේෂ මාර්ග සංවර්ධන වැඩසටහන (කුරුණෑගල නගරය කේන්ද්‍ර කරගත්)
    - ❖ ප්‍රජා පාදක පානීය ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරිම.
    - ❖ කුඩා නගර සංවර්ධනය කිරීම
    - ❖ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන
    - ❖ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන
    - ❖ ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන
    - ❖ ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන
    - ❖ විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

## 2.2 ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය – 2018

2018 අයවැය ඇස්තමේන්තුව අනුව රු. මිලියන 1234 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. 2017 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී නිම කරන ලද ව්‍යාපෘති වල බිල්පත් නිරවුල් කිරීමට අක්මුදල් ප්‍රමාණවත් නොවීම නිසා 2017.12.31 දිනට ඇතැති බිල්පත් පියවීම සඳහා රු.මිලි.234.37ක් හා 2017 අවිච්ඡේද ව්‍යාපෘති සඳහා රු.මිලි.46.25ක් වැයවිය.

| ව්‍යාපෘති | මුදල (රු.මිලි.) | 2018.12.31 දිනට වියදම (රු.මිලි.) |
|---|---|---|
| වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති | 130.12 | - |
| මාර්ග සංවර්ධන ව්‍යාපෘති | 222.82 | 224.51 |
| පානීය ජල ව්‍යාපෘති | 3.00 | 3.01 |
| කුඩා නගර සංවර්ධන ව්‍යාපෘති | 7.50 | 6.85 |
| අවිච්චේද ව්‍යාපෘති | 120.00 | 46.25 |
| එකතුව | 483.44 | 280.62 |

## 2.3 ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති - 2018

2018 ක්‍රියාත්මක සැලැස්මට වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලි.750.00 කි. 2018.12.31 වන තෙක් රු.මිලි. 756.23ක් පමණ වටිනා ව්‍යාපෘති 493ක ඇස්තමේන්තු අනුමත කර ඇත.

### 1. වාරිමාර්ග සංවර්ධන වැඩසටහන

වයඹ පළාතේ ගොවි ජනතාවගේ තම කෘෂි කර්මය වඩාත් කාර්යක්ෂම හා ඵලදායිව ක්‍රියාත්මක කර ඔවුන් ගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා 2016 වර්ෂයේ ආරම්භ කරන ලද සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය තවදුරටත් ඉදිරියට යමින් 2018 වර්ෂයේ සුළු වාරි මාර්ග ව්‍යාපෘති පුනරුත්ථාපනය කිරීම තව දුරටත් සිදු කෙරෙමින් පවතී. වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරහා ව්‍යාපෘති 07ක් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා රු.මිලි. 12.5ක් වෙන් කර ඇත. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරහා 17ක් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා රු.මිලි. 34. 21ක් වෙන් කර ඇත. 2018.12.31 වන විට වියදම රු.මිලි.7.99ක් වේ. එහි මූල්‍ය ප්‍රගතිය 69.03%කි.



බිංගිරිය මුත්තෙට්ටුව ජලාශය

## 2. ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම

2018 වර්ෂයේ මාර්ග 360 ක් කොන්ක්‍රීට්, තාර හා කුට්ටි ගල් අල්ලා වැඩිදියුණු කිරීමට සැළසුම් කර ඇත. ඉහත පරිදි වැඩි දියුණු කිරීමට මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා නිකවැරටිය, මහව, පොල්පිතිගම, වාරියපොළ, පොල්ගහවෙල වැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල අති දුෂ්කර මාර්ග වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය හා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය හරහා මෝටර් ග්‍රේඩර් කිරීම මඟින් මාර්ග කිලෝමීටර 117ක් සංවර්ධනය කිරීම ආරම්භ කර ඇත. මේ වන විට මාර්ග 57ක් අනුමත කර ඇති අතර අනුමත ව්‍යාපෘති වටිනාකම රු.මිලි. 4.7කි.

කොන්ක්‍රීට්, තාර හා කුට්ටි ගල් අල්ලා වැඩිදියුණු කිරීමට සැළසුම් කරඇති මාර්ග කිලෝමීටර 65ක් වැඩිදියුණු කරමින් පවතී. මේ වන විට මාර්ග 223ක් අනුමත කර ඇති අතර අනුමත ව්‍යාපෘති වටිනාකම රු.මිලි. 554.08කි. 2017 වසරේ අවිච්ඡේද ව්‍යාපෘති සඳහා රු.මිලි.35.05ක් ගෙවීම් කර ඇත.



කොස්ගොල්ල වැගමගෝනිගොඩ පාලම





පොතුවැපිටිය-පොල්පිතිගම මාර්ගය

## 3. පානිය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

වයඹ පළාතේ වියලි කලාපිය ප්‍රදේශ වල උග්‍ර පානීය ජල හිගකම සහ භූගත ජලයේ පවතින අධික ලවණ ගතිය නිසා වකුගඩු ආබාධයන්ට විසඳුමක් ලෙස ජාතික ජල සම්පාදන මණ්ඩලය හා වයඹ පළාත් ජල සම්පාදන ඒකකය එක්ව 2018 වර්ෂයේ හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 100 ක් වෙන්කර ඇත. මේ වන විට ජල යෝජනා ක්‍රම තුනක වැඩ අවසන් අදියරේ පවතින අතර ඉතිරි ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී. මේ වන විට රු.මිලියන 20.5 වියදමක් දරා ඇත.



**පිලාකටුමුල්ල පානීය ජල ව්‍යාපෘතිය**

## 4. කුඩා නගර සංවර්ධන වැඩසටහන

2018 වර්ෂයේ කුඩා නගර සංවර්ධනය යටතේ වාරියපොළ ආර්ථික මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය සඳහා රු.මිලි.15ක් වෙන් කර ඇති අතර ප්‍රතිසංස්කරණ කටයුතු නිම වෙමින් පවතී.

## 5. ජාතික ආහාර නිෂ්පාදන හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

2018 යොවුන් පුර වැඩසටහන යටතේ හඳුනාගන්නා ලද තරුණ තරුණියන්ට කෘෂි, පශු හා ධීවර අංශ යටතේ ස්වයං රැකියා නිරත කරවීම සඳහා රු.මිලියන 5 ක ප්‍රතිපාදන වෙන්කර ඇති අතර, ඒ අනුව මේ වන විට කෘෂි හා ධීවර අංශ යටතේ වාණිජ මල් වගාව සහ විසිතුරු මසුන් ඇති කිරීමට ව්‍යාපෘති 02 ක් වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන ලදී. ඉන් ව්‍යාපෘති 02 ක් 2018.12.31 දිනට අවසන් කර බිල්පත් ඉදිරිපත් කර ඇත.

## 2.4 2019 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

වයඹ පළාතේ ජනතාවගේ ජීවනෝපාය තව දුරටත් උසස් කිරීම සඳහා 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වෙමින් පවතින වැඩසටහන් සමග විශේෂයෙන් හඳුනා ගන්නා ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2019 වර්ෂය සඳහා සැළසුම්කර ඇත.

| අනු අංකය | වැඩසටහන | ව්‍යාපෘති සංඛ්‍යාව | වටිනාකම (රු.මි) |
|---|---|---|---|
| 1. | මාර්ග සංවර්ධන වැඩසටහන | 595 | 1,364.00 |
| 2. | වාරි මාර්ග සංවර්ධන වැඩසටහන | 238 | 329.00 |
| 3. | පානිය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 42 | 257.00 |
| | **එකතුව** | **875** | **1,950.00** |